ජාතික සමාජ සංවර්ධන ආයතනය

தேசிய சமூக அபிவிருத்தி நிறுவனம்

NATIONAL INSTITUE OF SOCIAL DEVELOPMENT

# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை

# ANNUAL REPORT

# 2024





ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு

Ministry of Rural Development, Social Security and Community Empowerment

# ජාතික සමාජ සංවර්ධන ආයතනය

**ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ උපාධි පිරිනමනු ලබන ආයතනයකි**

# වාර්ෂික වාර්තාව - 2024

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 01. | වාර්ෂික වාර්තාව 2024 | |
| | 1.1 හැඳින්වීම | 1 - 2 |
| | 1.2 පාලක සභාව | 2 - 3 |
| | 1.3 අධ්‍යයන කටයුතු පිළිබඳ මණ්ඩලය | 3 - 4 |
| | 1.4 විගණන හා කළමනාකරණ කමිටුව | 4 |
| | 1.5 කාර්යය මණ්ඩලය | 5 - 7 |
| 02. | අංශයන්හි ප්‍රගතිය | |
| | 2.1 පරිපාලන හා මුදල් අංශය | 8 |
| | 2.2 සමාජ සේවා විද්‍යාලය | 9 - 17 |
| | 2.3 පුහුණු අංශය | 18 - 31 |
| | 2.4 සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය | 32 - 37 |
| | 2.5 තත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය | 38 - 45 |
| 03. | අවසාන ගිණුම් - 2024 | 46 - 69 |
| 04. | විගණකාධිපති වාර්තාව | |
| | 4.1 විගණකාධිපති වාර්තාව | 70 |
| | 4.2 අවසාන ගිණුම් පිළිබඳ විගණන මතය | 71 - 75 |
| | 4.3 විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්ගේ නිරීක්ෂණයන් | 76 - 79 |

# ජාතික සමාජ සංවර්ධන ආයතනය

## දැක්ම

සමාජ වැඩ අධ්‍යාපනයේ  පුහුණු කටයුතුවල හා පර්යේෂණවල දේශීය හා ජාත්‍යන්තර ලෙස විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්වීම.

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය සහ සමාජ සුභසාධනය සඳහා සියලුම මට්ටම්වලදී අවශ්‍ය සමාජ වැඩ පිළිබඳ කුසලතා පූර්ණ මිනිස් බල අවශ්‍යතා සපුරාගැනීම සමාජ වැඩ පිළිබඳ අවශ්‍ය දැනුම හා තාක්ෂණයන් යොදා ගනිමින් සමාජයට සුවිශේෂී සේවයක් සැපයීම.

# සමාලෝචනය

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන ජාතික සමාජ සංවර්ධන ආයතනය ශ්‍රී ලංකාවේ සමාජ වැඩ අධ්‍යාපනය සපයන එකම උසස් අධ්‍යාපන ආයතනයයි.මෙම ආයතනය 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 25 ඒ වගන්තිය යටතේ උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇත. ඒ අනුව 2005 වර්ෂයේදී සමාජ වැඩ උපාධිය පිරිනැමීමේ බලය හා 2008 වර්ෂයේදී සමාජ වැඩ පශ්චාත් උපාධි පිරිනැමීමේ බලය ලබා දී ඇත. ආයතනය විසින් ක්‍රියාත්මක සියලුම උපාධි, පශ්චාත් උපාධි, උසස් ඩිප්ලෝමා, ඩිප්ලෝමා, සහතික පත්‍ර පාඨමාලා සහ පුහුණු හා පර්යේෂණ වැඩ සටහන් ජාතික අවශ්‍යතා සඳහා ගැලපෙන පරිදි අවශ්‍යතා තක්සේරු වාර්තා මත පදනම්ව සකස් කර ඇත. මෙම විෂය මාලා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ SLQF (Sri Lanka Qualifications Framework) නිර්දේශයන්ට අනුකූලව වෘත්තිකයන්, අධ්‍යාපනඥයින් සහ අභ්‍යන්තර කාර්ය මණ්ඩලය විසින් සකස් කර ඇත.

සමාජ වැඩ පිළිබඳ උපාධිය සහ සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සමාජ සේවා විද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රධාන වැඩසටහන් වේ. ඊට අමතරව සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමාව සහ සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන් පවත්වනු ලබයි. මෙම වැඩසටහන්වල විශේෂත්වය වන්නේ න්‍යායික දැනුම සමගින් ප්‍රයෝගික ක්ෂේත්‍ර පුහුණුව මත පදනම් වූ කුසලතා සංවර්ධනය කිරිමයි. පුහුණු අංශය මගින් කෙටි කාලින හා දිගු කාලින පුහුණු වැඩසටහන් මෙන්ම අම්පාර, තලාව, කිළිනොච්චිය ප්‍රාදේශිය මධ්‍යස්ථාන පදනම් කරගනිමින් ඩිප්ලෝමා, සහතික පත්‍ර පාඨමාලා සහ කෙටි කාලින පුහුණු වැඩ සටහන් පවත්වනු ලබයි. ඊට අමතරව දිවයින පුරා රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල ඉල්ලිම් වලට අනුව සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ නිළධාරින්ගේ හැකියාවන් වර්ධනය කිරිම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. එසේම උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා කිහිපයක් සහ උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලා ගාස්තු අයකිරිමේ පාඨමාලා ලෙස පවත්වනු ලැබේ. උපදේශන පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර එය උපාධි පාඨමාලාවක් දක්වා සංවර්ධනය කිරිමට අවශ්‍ය කටයුතු සකස් කර ඇති අතර දැනට පවතින විෂය මාලාව උසස් අධ්‍යාපන අමත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය විසින් පර්යේෂණ හා ප්‍රකාශන එළිදැක්වීම,සම්මන්ත්‍රණ හා පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම සිදුකරනු ලබයි. පර්යේෂණ පදනම් කර ගනිමින් අංශය විසින් සකස් කරන ලද පර්යේෂණ වාර්තා සහ ප්‍රකාශන සමාජ සංවර්ධන හා සමාජ සුභසාධන ක්ෂේත්‍රවල දියුණුව සඳහා බෙහෙවින් භාවිතා කළ හැකිය. ආයතනයේ අධ්‍යයන වැඩසටහන් ගුණාත්මකව පවත්වාගෙනයාමේ පහසුව සඳහා ඉහත ප්‍රධාන අංශවලට අමතරව තත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය, සමාජ වැඩ පිළිබඳ අධ්‍යයන අංශය, මානව විද්‍යා හා වෘද්ධ විද්‍යා අධ්‍යයන අංශය, සමාජ විද්‍යා හා සමාජ සංවර්ධන අධ්‍යයන අංශය, උපදේශන හා මනෝ විද්‍යා අධ්‍යයන අංශය, ශිෂ්‍ය සුභසාධන අංශය, විෂය මාලා සංවර්ධන මධ්‍යස්ථානය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ මධ්‍යස්ථානය වශයෙන් අධ්‍යයන අංශ හා අධ්‍යයන උපකාරක මධ්‍යස්ථාන කිහිපයක් ස්ථාපිත කර ඇත.

ආයතනයට අනුබද්ධ පුහුණු මධ්‍යස්ථාන තුනක් අනුරාධපුර තලාව, අම්පාර සහ කිළිනොච්චිය යන ප්‍රදේශවල පිහිටුවා ඇත. මෙම ප්‍රාදේශිය මධ්‍යස්ථාන පිහිටුවීමේ මූලික පරමාර්ථයන් වන්නේ සීදුව ප්‍රධාන කාර්යාලයේ දී පිරිනමන වැඩසටහන් ශ්‍රී ලංකාව පුරා විවිධ ප්‍රදේශවල වෙසෙන සිංහල, දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන් වෙත ව්‍යාප්ත කිරිමයි.

(ඇ) ආයතනය 2020 වර්ෂයේ දී සීදූව ලියනගේමුල්ල ප්‍රදේශයේ ස්ථාපනය කිරීමත් සමඟ සිසුන් කැලණියේ නේවාසිකාගාරයෙන් ඉවත් වී සීදූව අවටින් නේවාසිකවීම සිදුවිය.2020 වසරේ මාර්තු මස සිට ආරම්භ වූ කොවිඩ් වසංගතය හේතුවෙන් ආයතනයේ සියලු පාඨමාලාවන්හි සියලුම දේශන මාර්ගත ක්‍රමයට සිදු කරන ලදී.2022 වසරේ දී කැලණිය නේවාසිකාගාරයේ අලුත් වැඩියා කටයුතු වෙනුවෙන් කැළණිය ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරීන්ගෙන් ලබාගත් වැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 3.1ක් විය.පාලක සභාවේ උපදෙස් පරිදි නේවාසිකාගාරය ආයතනයේ කාර්යමණ්ඩලයට නේවාසික පහසුකම් ලබාදීමට හෝ කැලණිය විශ්ව විද්‍යාලයේ සිසුන්ට නේවාසිකවීම සඳහා ලබාදීමට කටයුතු කරන ලෙස පාලක සභා පත්‍රිකා අංක 29/03/2023 හා 2023.06.30 දිනැති පාලක සභාව විසින්ද උපදෙස් ලබා දී ඇත.

මේ අනුව කටයුතු සිදුකළද කාර්ය මණ්ඩලය හෝ කැලණිය විශ්ව විද්‍යාලයේ සිසුන් නේවාසිකවීම සිදු නොකරන ලදී.ඒ අනුව නැවත පාලක සභා පත්‍රිකා අංක 62/04/2024 මගින් උපදෙස් ලබාදෙන ලද්දේ ප්‍රමාණවත් බදු මුදලකට වෙනත් පර්ශවයකට නේවාසිකාගාරය ලබාදෙන ලෙසය. නමුත් මේ සඳහා උත්සාහ කලද ගොඩනැගිල්ල අලුත්වැඩියා කරදෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් විය.ගොඩනැගිල්ලේ 2023 වර්ෂයේ සිදු කරන ලද රජයේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන 10.06 ක් හා ගොඩනැගිල්ලේ අලුත් වැඩියාව සඳහා යන වියදම පිළිබඳ සලකා බලන ලද පාලක සභාව නේවාසිකාගාරය පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස 2024 /10/04 දිනැති පාලක සභාව විසින් උපදෙස් ලබා දුන් අතර එම විස්තරාත්මක වාර්තාව 2024/12/ 13 දිනැති ආයතනයේ පාලක සභාව වෙත පාලක සභා පත්‍රිකා 144/12/2024මගින් ඉදිරිපත් කරන ලදී.2025 වර්ෂයේ ආයතනයේ පාලක සභාවේ සාමාජිකයින් වෙනස්වීම මත නැවත වතාවක් මේ සම්බන්ධව තීරණයක් ගැනීම සඳහා 2025 පෙබරවාරි හා මාර්තු මස පැවැති පාලක සභාව වෙත නේවාසිකාගාරයේ තොරතුරු ඉදිරිපත් කරන ලදී.

මින් අනතුරුව 2025.03.04 දිනැති ආයතනයේ විගණන හා කළමනාකරන කමිටු රැස්වීමේදීද සාකච්ඡා වූ අතර එහිදී අමාත්‍යාංශය යටතේ පවතින වැඩිහිටි ලේකම් කාර්යාලයේ හෝ ආබාධිත ලේකම් කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා මෙම ගොඩනැගිල්ල යොදා ගැනීමට හැකියාව පිළිබඳව සොයා බලන ලෙස උපදෙස් ලබා දුන් අතර ඒ අනුව එම ආයතන මගින් ගොඩනැගිල්ල නිරීක්ෂණය කරන ලදී.නමුත් ඒ පිළිබඳ ඉල්ලීමක් නොවූ හෙයින් 2025.03.21 දිනැති ආයතනයේ පාලක සභාව පාලක සභා පත්‍රිකා 15/03/2025 මගින් උපදෙස් ලබා දෙන ලද්දේ දේපළ අයිතිය නැවත තහවුරු කර ගැනීම,නැවත දේපළ වටිනාකම් පිළිබඳ ඇගයීමක් සිදුකර ගෙන ගොඩනැගිල්ල විකුණා සිදුව අවටින් ගොඩනැගිල්ලක් මිලදී ගැනීම සඳහා අවශ්‍යතාවය පැහැදිලි කරමින් සාධාරණීකරණය (justification) කරන ලද පැහැදිලි වාර්තාවක් ඇතුළත් කරමින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසයි.මේ සඳහා අවශ්‍ය මූලික කටයුතු ඉටුකරමින් පවතින බව සඳහන් කරමි.

මහාචාර්ය ඩී.ඒ. ප්‍රේමකුමාර ද සිල්වා
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
ජාතික සමාජ සංවර්ධන ආයතනය

# ජාතික සමාජ සංවර්ධන ආයතනය

## 01. වාර්ෂික වාර්තාව - 2024

### 1.1 හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනය ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන උසස් අධ්‍යාපන ආයතනයකි. ජාතික සමාජ සංවර්ධන ආයතනය සමාජ සංවර්ධනය, සමාජ සුභසාධනය සහ සමාජ සවිබලගැන්වීමට අදාළ සමාජ වැඩ පිළිබඳ උපාධි, පශ්චාත් උපාධි සහ සමාජ ඩිප්ලෝමා මෙන්ම උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා පවත්වාගෙන යනු ලබයි. එය 1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධාන යටතේ ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකාවේ සමාජ වැඩ අධ්‍යාපනය සපයන එකම රාජ්‍ය ආයතනයද මෙම ආයතනය වේ. සමාජ වැඩ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වර්ෂ 2005 දී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය අනුව 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ ජාතික සමාජ සංවර්ධන ආයතනය උපාධි පිරිනමනු ලබන ආයතනයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හා සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය පිරිනැමීමේ බලය ලබා දී ඇත.

**දැක්ම**

සමාජ වැඩ අධ්‍යාපනයේ පුහුණු කටයුතුවල හා පර්යේෂණවල දේශීය හා ජාත්‍යන්තර ලෙස විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්වීම.

**මෙහෙවර**

ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය සහ සමාජ සුභසාධනය සඳහා සියලුම මට්ටම්වලදී අවශ්‍ය සමාජ වැඩ පිළිබඳ කුසලතා පූර්ණ මිනිස් බල අවශ්‍යතා සපුරාගැනීම සමාජ වැඩ පිළිබඳ අවශ්‍ය දැනුම හා තාක්ෂණයන් යොදා ගනිමින් සමාජයට සුවිශේෂී සේවයක් සැපයීම.

**අරමුණු**

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ සඳහන් කර ඇති පරිදි ආයතනයේ අරමුණු වනුයේ,

(අ) සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම්, වැඩසටහන් සහ වැඩ කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම.

(ආ) සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය පිළිබඳ උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම.

(ඇ) සමාජ සුභ සාධන ක්‍රම සහ සමාජ සංවර්ධන වැඩ සටහන් පිළිබඳව අධ්‍යයන කටයුතු පැවැත්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම.

(ඈ) සමාජ වැඩ වලදී තාක්ෂණය උපයෝගී කර ගැනීම ඇතුළුව සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපන ක්‍රමයෙහි නිර්මාණාත්මක පරිචයක් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ඉ) සමාජ සුභසාධන ක්‍රමයේ කාර්ය මණ්ඩලයේ වෘත්තීමය සහ කළමනාකාරිත්ව ප්‍රවීණතාව වර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.

(ඊ) සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය සම්බන්ධයෙන් විශේෂඥ සේවාවන් ආණ්ඩුවට සහ වෙනත් අනුමත සංවිධානයන්ට ලබා ගැනීමට සැලැස්වීම.

(උ) ඒ සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

**ඉහත කරුණු සාක්ෂාත් කරගැනිම සඳහා මෙම ආයතනය පහත සඳහන් කාර්යන්හි නිරත වේ.**

01. සමාජ වැඩ වෘත්තියවේදි අධ්‍යාපනය ලබා දීම.
02. සමාජ වැඩ පිළිබඳ දේශිය හා ජාත්‍යන්තර පුහුණු පාඨමාලා පැවැත්විම.
03. සමාජ වැඩ සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම හා ප්‍රකාශන පළ කිරිම.
04. සමාජ සුභසාධන ක්ෂේත්‍රයේ උපදේශන සේවා පැවැත්විම.
05. සමාජ සුභසාධන කටයුතු වල නියැලි සිටින රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල සේවකයින්ගේ කළමනාකරණ හා වෘත්තිය කුසලතා වැඩි දියුණු කිරිම.
06. සමාජ සුභසාධන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරිම පිළිබඳ ගරු ඇමතිතුමාට අවශ්‍ය සහය ලබා දිම.

**ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ක්‍රියාත්මක වැඩසටහන් පහත සඳහන් පරිදිය.**

01. සමාජ වැඩපිළිබඳ ශාස්ත්‍රපති, සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා, සමාජ වැඩ ඩිප්ලෝමා, අතුරු වෘත්තීය පාඨමාලා හා වෙනත් පුහුණු පාඨමාලා සඳහා විෂයමාලා සංවර්ධනය, සංවිධානය කිරීම, පැවැත්වීම සහ ක්ෂේත්‍ර වැඩ සම්බන්ධීකරණය.
02. සමාජ සුභසාධන හා සමාජ ප්‍රතිපත්ති පිළිබඳ පර්යේෂණ දියුණු කිරීම, පැවැත්වීම හා ක්‍රියාත්මක කිරීම
03. සමාජ වැඩ ප්‍රකාශන හා පත්‍රිකා එළි දැක්වීම.
04. සමාජ සුභසාධන කාර්යන්හි නියැලෙන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල නිලධාරීන්ගේ වෘත්තිමය කළමනාකරණ සංවර්ධනය කිරිම සඳහා විදේශීය හා දේශීය ආයතන වල මූල්‍ය පහසුකම් ඇතිව සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම.
05. ගරු ඇමතිතුමාට සමාජ සුභසාධන ප්‍රතිපත්ති සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට, සහාය වීම සඳහා එතුමාගේ සාකච්ඡා හා කාර්ය මණ්ඩල රැස්වීම් වලදි ප්‍රතිපත්තිමය තීරණ ගැනිමට සහය වීම සහ ඒ සඳහා ලිඛිත යෝජනා ඉදිරිපත් කිරීම.
06. රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශ වල සමාජ සුභසාධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේදි සමාජ වැඩ සිසුන් එම ආයතන වලට ඔවුන්ගේ ව්‍යාපෘති මගින් අනුයුක්ත කිරීම, ඔවුන්ගේ සංවර්ධන ක්‍රියාදාමයන්ට අවශ්‍ය මාර්ගෝපදේශයන් සැපයිම, ඔවුන්ගේ සේවාවන් වඩාත් අර්ථවත් පිණිස උපදේශන සේවා රැස්වීම් හා සම්මන්ත්‍රණ පැවැත්වීම.

## 1.2 පාලක සභාව

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 7 (1) උප වගන්තිය ප්‍රකාරව 2024 වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතන පාලක සභාවේ සංයුතිය මෙසේය.

| | | | |
|---|---|---|---|
| 01. | යමුනා පෙරේරා මහත්මිය | - | ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය (සභාපති - නිල බලයෙන් )<br>2023.01.01 දින සිට 2024.09.23 දක්වා |
| 02. | රංජිත් ආරියරත්න මහතා | - | ලේකම් - බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය (සභාපති - නිල බලයෙන්)<br>2024.09.24 සිට 2024.11.24 දක්වා |

| | | | |
|---|---|---|---|
| 03. | මලර්මදී ගන්ගාදරන් මහත්මිය | - | ලේකම් - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය (සභාපති - නිල බලයෙන්) 2024.11.25 සිට මේ දක්වා |
| 04. | ආචාර්ය රවීන්ද්‍ර විතානච්චි මහතා | - | 2023.05.24 සිට මේ දක්වා |
| 05. | පී.ඒ.තිලකරත්න මහතා | - | සාමාජික - 2023.02.02 සිට මේ දක්වා |
| 06. | මහාචාර්ය ප්‍රේමකුමාරද සිල්වා මහතා | - | සාමාජික - 2020.07.08 දින සිට මේ දක්වා |
| 07. | මහාචාර්ය ආර්.එම්.කේ. රත්නායක මහතා | - | සාමාජික - 2020.07.08 දින සිට මේ දක්වා |
| 08. | මහාචාර්ය එච්.එම්.එස්.සී.බී. හීන්කෙන්ද මහතා | - | සාමාජික - 2023.04.21 දින සිට මේ දක්වා |
| 09. | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්.ඩී.වයි. දේවිකා ජයතිලක මහත්මිය | - | සාමාජික - 2023.04.21 දින සිට මේ දක්වා |
| 10. | මහාචාර්ය ඊ.ඒ.ඩී.ඒ.එදිරිසිංහ මහත්මිය | - | සාමාජික - 2023.04.21 දින සිට මේ දක්වා |
| 11. | මහාචාර්ය එම්.ඒ.ඩී.එස්.ජේ.එස්. නිරිඇල්ල මහත්මිය | - | සාමාජික - 2024.04.16 දින සිට මේ දක්වා |
| 12. | මහාචාර්ය එස්.පී. ප්‍රේමරත්න මහතා | - | සාමාජික - 2024.04.16 දින සිට මේ දක්වා |
| 13. | නියෝජ්‍ය පොලිස්පති ජාලිය නිශාන්ත සේනාරත්න මහතා | - | සාමාජික - 2024.04.16 දින සිට මේ දක්වා |
| 14. | දුමින්ද නෙත්තසිංහ නානායක්කාර මහතා | - | සාමාජික -2024.04.29 දින සිට මේ දක්වා |
| 15. | ගෝඨාභය ජයරත්න මහතා | - | සාමාජික - 2020.02.28 දින සිට 2024.04.16 දක්වා |
| 16. | චන්දිමා වික්‍රමසිංහ මිය | - | සාමාජික - 2020. 02.28 දින සිට 2024.04.16 දක්වා |
| 17. | ඩී. විදානගමආච්චි මහතා | - | සාමාජික - 2020.02.28 දින සිට 2024.04.20 දක්වා |
| 18. | ඩබ්.ආර්.පී.යූ. නුවන්ති මෙය | - | සාමාජික - 2023.02.27 දින සිට මේ දක්වා |
| 19. | ආචාර්ය ඉරේෂා දර්ශනී මෙය | - | සාමාජික - 2020.02.28 දින සිට 2024.04.20 දක්වා |

## 1.3 අධ්‍යයන කටයුතු මණ්ඩලය

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 10 (1) උප වගන්තිය ප්‍රකාරව පත් කරන ලද අධ්‍යයන කටයුතු මණ්ඩලය මෙසේය.

| | | | |
|---|---|---|---|
| 01. | යමුනා පෙරේරා මහත්මිය | - | ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය 2023.01.01 දින සිට 2024.09.23 දක්වා |
| 02. | රංජිත් ආරියරත්න මහතා | - | ලේකම්- බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය 2024.09.24 සිට 2024.11.24 දක්වා |
| 03. | මලර්මදී ගන්ගාදරන් මහත්මිය | - | ලේකම් - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය 2024.11.25 සිට මේ දක්වා |
| 04. | ආචාර්ය රවීන්ද්‍ර විතානච්චි මහතා | | 2023.05.24 සිට මේ දක්වා |
| 05. | එම්.ටී.ආර්. ෂාමිණි අත්තනායක මිය | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් 2017.01.16 සිට 2024.02.02 දක්වා |

| | | | |
|---|---|---|---|
| 06. | මහාචාර්ය ඩබ්.එම්. ධනපාල මහතා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයන අංශය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| 07. | මහාචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා | - | අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය. |
| 08. | මහාචාර්ය උපාලි පන්නිලගේ මහතා | - | පීඨාධිපති - මානව ශාස්ත්‍ර පීඨය, රුහුණ විශ්ව විද්‍යාලය |
| 09. | මහාචාර්ය සුභාංගනී එම්.කේ. හේරත් මිය | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - සමාජ විද්‍යා අංශය, කැළණිය විශ්ව විද්‍යාලය |
| 10. | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ.ඩබ්.කේ.ඩබ්. සුභසිංහ මහත්මිය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ,සමාජ විද්‍යා අධ්‍යන අංශය, කැළණිය විශ්ව විද්‍යාලය . |
| 11. | ආචාර්ය එස්.එම්.ඒ.කේ. සමරකෝන් මහතා | - | අංශාධිපති - වාණිජ හා කළමනාකරණ පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 12. | ගෞරි වාසුදේවන් මිය | - | අධ්‍යක්ෂ (පුහුණු අංශය), ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 13. | වර්ධරාජා ජෙයරුබන් මහතා | - | අධ්‍යක්ෂ (සමාජ සේවා විද්‍යාලය)(වැ.බ.), ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 14. | එම්.එස්.එම්. අස්මියාස් මහතා | - | අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන ප්‍රතිපත්ති පර්යේෂණ හා ප්‍රකාශන අංශය), ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 15. | ඒ.බී.දිනිදු තාරුෂ මහතා | - | ලේඛකාධිකාරි, ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 16. | එස්. එරංග මෙන්ඩිස් මහතා | - | සහකාර ලේඛකාධිකාරී (වැ.බ.) |

## 1.4 විගණන හා කළමනාකරණ කමිටුව

| | | | |
|---|---|---|---|
| 01. | පී.ඒ. තිලකරත්න මහතා | - | සාමාජික 2023.02.02 සිට මේ දක්වා |
| 02. | ඞී. විදානගමාච්චි මයා | - | සාමාජික 2020.02.28 සිට 2024.04.28 දක්වා |
| 03. | දුමින්ද නෙත්තසිංහ නානායක්කාර මහතා | - | සාමාජික -2024.04.29 දින සිට මේ දක්වා |
| 04. | ඞී.එම්.ජී.පී. මල්කාන්ති මිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක (කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය) |
| 05. | එම්.ඞී.අයි. මලගල මිය | - | විගණන අධිකාරී (ජාතික විගණන කාර්යාලය) පළමුවන හා දෙවන විගණන රැස්වීම් සඳහා |
| 06. | කේ. කරුණාරත්න මයා | - | සහකාර විගණකාධිපති (ජාතික විගණන කාර්යාලය ) තුන්වන හා හතරවන රැස්වීම් සඳහා |

**ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සහභාගීත්වය**

| | | | |
|---|---|---|---|
| 01. | ආචාර්ය රවීන්ද්‍ර විතානාච්චි මයා | - | අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) 2023.05.24 සිට 2025.01.27 දක්වා |
| 02. | එල්.කේ. පුෂ්පකාන්ති මිය | - | අධ්‍යක්ෂ (පාලන හා මුදල්) |
| 03. | යූ.ඞී.ඞී.ඞී උස්හෙට්ටි මිය | - | අභ්‍යන්තර විගණක |
| 04. | ඊ.එච්. ලසිකා මධුවන්ති මිය | - | ගණකාධිකාරී |
| 05. | දිනූෂා කාරියවසම් මිය | - | ගිණුම් නිලධාරී |

## 1.5 කාර්යය මණ්ඩලය

**(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය**

2024 වර්ෂය තුල ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංයුතිය මෙසේය.

| | | |
|---|---|---|
| 01. එම්.ටී.ආර්. ෂාමිණී අත්තනායක මිය | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන) 2017.01.16 සිට 2024.02.02 දක්වා |
| 02. වරදගෞරි වාසුදේවන් මිය | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන) (රා. ආ.) – 2024.09.25 සිට මේ දක්වා |

**සමාජ සේවා විද්‍යාලයේ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.**

| | | |
|---|---|---|
| 01. වර්ධරාජා ජෙයරුබන් මහතා | - | කථිකාචාර්ය II - 2006.07.03 සිට 2012.07.02 දක්වා<br>කථිකාචාර්ය I - 2012.07.03 සිට2017.07.31 දක්වා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - 2017.08.01 සිට මේ දක්වා |
| 02. ඊ.ඒ.එම්.එස්.ජී. විජේසේකර මිය | - | කථිකාචාර්ය II - 2006.07.03 සිට 2012.07.06 දක්වා<br>කථිකාචාර්ය I - 2012.07.07 සිට 2017.07.31 දක්වා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 2017.08.01 සිට මේ දක්වා |
| 03. ආචාර්ය යූ.එල්.එම්. අෂ්කර් මහතා | - | කථිකාචාර්ය II 2009.03.02 සිට 2015.03.01 දක්වා<br>කථිකාචාර්ය I 2015.03.02 සිට 2024.09.27 දක්වා |
| 04. වී. බාලමති මිය | - | කථිකාචාර්ය II 2013.09.16 සිට මේ දක්වා |
| 05. එච්.එම්.ඩී.එස්. හේරත් මිය | - | කථිකාචාර්ය II 2014.05.02 සිට මේ දක්වා |
| 06. එල්.සී. ඉනෝකා ජයසේන මිය | - | කථිකාචාර්ය II 2015.12.01 සිට මේ දක්වා |
| 07. ඒ.එම්. මානාමුදලි මිය | - | කථිකාචාර්ය II 2018.08.01 සිට මේ දක්වා |
| 08. ඩී.එම්.සී.ජනක බණ්ඩාර මයා | - | කථිකාචාර්ය II 2023.04.17 සිට මේ දක්වා |
| 09. ටී. තර්ෂන් මයා | - | කථිකාචාර්ය II 2023.04.17 සිට මේ දක්වා |
| 10. කේ.පී.ආර්.එස්. අසංගිකා මෙ.වි. | - | කථිකාචාර්ය II 2023.04.17 සිට මේ දක්වා |
| 11. ඒ.එච්. ඉන්දික සංජීව මයා | - | කථිකාචාර්ය II 2023.04.17 සිට මේ දක්වා |
| 12. අයි.එම්.එම්.කේ. ඉහලගෙදර මිය | - | කථිකාචාර්ය II 2023.05.15 සිට මේ දක්වා |
| 13. කේ.සී.කේ. ද තාබෲ මිය | - | කථිකාචාර්ය II 2024.08.01 සිට මේ දක්වා |
| 14. ආර්.එම්.කේ.එම්. සන්දීප මයා | - | කථිකාචාර්ය II 2024.11.12 සිට මේ දක්වා |
| 15. ෆාතිමා ෂික්රා මෙය. | - | ඉංග්‍රීසි උපදේශක - 2024.07.01 සිට මේ දක්වා |
| 16. ඩී.එම්.ඩබ්.කේ. චන්ද්‍රසිරි මහතා | - | පුස්තකාලයාධිපති - 2015.06.01 සිට මේ දක්වා |

**පුහුණු අංශයේ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.**

01. වරදගෞරි වාසුදේවන් මිය - අධ්‍යක්ෂ (පුහුණු) 2015.05.05 සිට මේ දක්වා
02. දීප්ති නිරෝෂිකා මිය - පුහුණු නිලධාරි II 2007.03.01සිට 2013.02.28 දක්වා
පුහුණු නිලධාරි I 2013.03.01 සිට2018.07.31 දක්වා
ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරී 2018.08.01 සිට මේ දක්වා
03. කුමුදිනි වැදිසිංහ මිය - පුහුණු නිලධාරි II 2012.05.01 සිට 2019.09.30 දක්වා
ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරී 2019.10.01 සිට මේ දක්වා
04. බි.කේ.එස්. කරුණාරත්න මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
05. පි.සි. හෙට්ටිආරච්චි මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
06. ඒ.එම්.කේ.එල්. අධිකාරි මිය - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
07. ඒ.එච්. උබයදුල්ලා මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
08. ජේ.එච්.අයි. ප්‍රසාද් මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
09. ටී. තර්ෂන් මහතා - පුහුණු නිලධාරි II 2013.09.02 සිට 2023.04.16 දක්වා
10. වයි.එම්. නිම්සාත් මහතා - පුහුණු නිලධාරි II 2017.07.03 සිට මේ දක්වා

**පර්යේෂණ අංශයේ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.**

01. එම්.එස්.එම්. අස්මියාස් මහතා - අධ්‍යක්ෂ (පර්යේෂණ) 2017.05.01 සිට මේ දක්වා
02. ජේ.කේ.පි.යු. කීර්ති මහතා - පර්යේෂණ නිලධාරි 2013.08.01 සිට 2018.07.31දක්වා
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී 2018.08.01 සිට මේ දක්වා
03. එස්. හරිහරතාමෝදරන් මයා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී 2018.08.01 සිට මේ දක්වා
04. එච්.කේ.එස්.කේ. සිරිකුමාර මිය - පර්යේෂණ නිලධාරි 2014.05.02 සිට මේ දක්වා
05. බි.ඒ. නිලූකා විජේබණ්ඩාර මිය - පර්යේෂණ නිලධාරි 2017.01.16 සිට මේ දක්වා
06. ඒ.එච්. ඉන්දික සංජීව මහතා - පර්යේෂණ සහකාර 2014.05.02 සිට 2024.04.16 දක්වා
07. කේ.සී.කේ.ද තාබෲ මිය - පර්යේෂණ සහකාර 2014.05.02 සිට 2024.07.31 දක්වා
08. එස්.එච්.එන්. මධුෂානි සිල්වා මෙය - පර්යේෂණ සහකාර 2014.05.02 සිට මේ දක්වා

**(ආ) අනධ්‍යයන කාර්ය මණ්ඩලය**

2024 වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පරිපාලන අංශයේ සංයුතිය පහත පරිදි වේ.

01. ආචාර්ය රවීන්ද්‍ර විතානච්චි මහතා - 2023.05.24 සිට මේ දක්වා
02. එල්.කේ. පුෂ්පකාන්ති මිය - අධ්‍යක්ෂ (පාලන හා මුදල්) 2017.03.01 සිට මේ දක්වා
03. යූ.ඩී.ඩී. ධනුෂ්කා උස්හෙට්ටි මිය - අභ්‍යන්තර විගණක 2011.10.17 සිට මේ දක්වා
04. ඊ.එච්. ලසිකා මධුවන්ති මිය - ගණකාධිකාරී 2021.12.15 සිට මේ දක්වා
05. ඒ.බී. දිනිදු තාරුෂ මහතා - ලේඛකාධිකාරි 2024.07.15 සිට මේ දක්වා

**පරිපාලන අංශයේ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.**

| **තනතුර** | **අනුමත සේවක සංඛ්‍යා** | **ස්ථිර** | **ද්විතියන පදනම** | **අනියම්** |
|---|---|---|---|---|
| 01. ගිණුම් නිලධාරී | 01 | 01 | - | - |
| 02. පරිපාලන නිලධාරී | 01 | 01 | | |
| 03. සහකාර ලේඛකාධිකාරී | 01 | - | - | - |
| 04. පරිගණක වැඩසටහන් සම්පාදක | 01 | 01 | - | - |
| 05. ව්‍යාපෘති වැඩසටහන් සම්පාදක | 01 | - | - | - |
| 06. භාෂා පරිවර්තක | 02 | - | - | - |
| 07. වැඩසටහන් සහකාර (ස්ථානභාර) | 04 | 03 | - | - |
| 08. කළමනාකරණ සහකාර | 35 | 30 | - | - |
| 09. නේවාසිකාගාර පාලිකා | 01 | 01 | - | - |
| 10. ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික | 01 | - | - | - |
| 11. රියදුරු | 09 | 07 | - | - |
| 12. ශ්‍රව්‍ය දෘශ්‍ය සහායක | 01 | 01 | - | - |
| 13. කාර්යාල කාර්ය සහායක | 15 | 12 | - | - |

## 2. 2024 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අංශයන්හි ප්‍රගතිය

### 2.1 පාලන හා මුදල් අංශය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු. මි) | තත්‍ය වියදම (රු. මි) | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණය % ලෙස |
|---|---|---|---|
| පුනරාවර්තන | 162.00 | 153.80 | 94.75% |
| ප්‍රාග්ධන | 15.00 | 14.96 | 99.73% |
| සීදූව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම් | 100.00 | 98.91 | 98.91% |

සීදූව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන අමාත්‍යාංශයේ වැය ශිර්ෂය වෙත වෙන්කරනු ලබයි. Wing A හා Wing B ලෙස නම් කරන ගොඩනැගිලි සංකීර්ණයේ Wing B ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කර ඇති අතර Wing A ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 98.19% ක් අවසන් කර ඇත.

### Wing A ගොඩනැගිල්ල

**ඉදිරිපස පෙනුම**




### Wing B ගොඩනැගිල්ල




# සමාජ සේවා විද්‍යාලය

සමාජ සේවා විද්‍යාලය යනු ජාතික සමාජ සංවර්ධන ආයතනයේ විශාලතම සහ පැරණිතම අංශයයි. 1952 දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන ආරම්භ කිරීමත් සමඟ වෘත්තීය සමාජ වැඩ අධ්‍යාපනය ආරම්භ කරන ලදී. එය 1964 දී ලංකා සමාජ සේවා විද්‍යාලය ලෙසත් 1972 දී ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය ලෙසත් නම් කරන ලද අතර එය රජයේ ආයතනයක් ලෙස ක්‍රියාත්මක විය. සමාජ වැඩ විද්‍යාලය සමාජ වැඩ පිළිබඳ වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් පවත්වන අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබේ. ආරම්භයේදී, ආයතනය විසින් කෙටි කාලීන පුහුණු වැඩසටහන් පමණක් පවත්වන ලදී. වර්තමානයේ, සමාජ සේවා විද්‍යාලය ප්‍රධාන අධ්‍යයන වැඩසටහන් පවත්වයි. එනම් 1978 වසරේ සිට සමාජ වැඩ ඩිප්ලෝමාව (SWD), 2013 වසරේ සිට සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා වැඩසටහන (HDSW), 2005 සිට සමාජ වැඩ උපාධිය සහ 2008 සිට සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ කෙටි කාලීන සහ අර්ධකාලීන ප්‍රජා සම්බන්ධතා වැඩසටහන් කිහිපයක් ද පවත්වනු ලබයි. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ නියෝගයෙන් සමාජ වැඩ පිළිබඳ උපාධිය, 2005 ජූනි 01 දින අංක 1395/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද අතර, 2008 ජූලි 07 දින අංක 1557/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ නියෝගයෙන් සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ආරම්භ කරන ලදී.





මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අරමුණු පහත පරිදි දැක්විය හැක.

**අරමුණු**

1. සමාජ වැඩ අධ්‍යාපනය සඳහා නව වැඩසටහන් හඳුන්වාදීම.
2. පවතින අධ්‍යාපන වැඩසටහන් වැඩිදියුණු කිරීම.
3. සමාජ වැඩ අධ්‍යාපනයේ තොරතුරු තාක්ෂණ සහ ඉංග්‍රීසි භාවිතය වැඩිදියුණු කිරීම.
4. වෘත්තීය පිළිගැනීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
5. සමාජ සංවර්ධනය සහ සමාජ බලගැන්වීම සඳහා සමාජ වැඩ වෘත්තිකයන් බිහි කිරීම.

## සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන




(වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය - 2024)

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ආරම්භ වූ සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහනේ පළමු කණ්ඩායම, කැනඩාවේ කිංග්ස්ටන්හි ක්වීන්ස් විශ්ව විද්‍යාලය විසින් සමාජ සේවා සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක කරන ලද කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සියේ (CIDA) අනුග්‍රහය යටතේ ආරම්භ විය.

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහනේ අරමුණ වන්නේ සමාජ සුභසාධන ක්ෂේත්‍රයේ සේවය කිරීම සඳහා වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් සහ කළමනාකරණමය වශයෙන් දක්ෂ ශ්‍රම බලකායක් බිහි කිරීම සහ එමඟින් රටේ පුරවැසියන්ගේ සමාජ සංවර්ධනය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමයි. සහභාගිවන්නන්ට සමාජ වැඩ පිළිබඳ උසස් දැනුමක් ලබා දීම සහ සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ නායකයින් ලෙස ප්‍රතිපත්ති සම්පාදනයට ක්‍රියාකාරීව සහභාගී විය හැකි වන පරිදි ආකල්ප වෙනස් කිරීම සඳහා ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත.

### සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති (MSW) වැඩසටහනේ අරමුණු

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ, සමාජ වැඩවල දැනටමත් නියැලී සිටින උපාධිධාරීන්ගේ / අනෙකුත් සමාන සුදුසුකම් ලත් පුද්ගලයින්ගේ නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශවල ඇති ඉල්ලුම සපුරාලීමයි. කළමනාකරණ මට්ටමින් රටේ වෘත්තීය සමාජ සේවකයින්ගේ හදිසි අවශ්‍යතාවය සපුරාලීම සඳහා සමාජ වැඩ පිළිබඳ උසස් දැනුම ලබා ගැනීමට අනෙකුත් විෂයයන්ගෙන් උපාධිධාරීන්ට සහ අනෙකුත් සමාන සුදුසුකම් ලත් පුද්ගලයින්ට අවස්ථා ලබා දීම.

### පාඨමාලාවේ විෂය අන්තර්ගතය

ශාස්ත්‍රපති උපාධියේ විෂය මාලාව සමාජීය විද්‍යාවන්ට අදාළ විෂයයන් මෙන්ම සමාජ වැඩ විෂයට අදාළ පාඨමාලා වලින් සමන්විත වේ. න්‍යායාත්මක දැනුම මෙන්ම ප්‍රායෝගික දැනුම ලබා ගැනීම සඳහා සිසුන් ක්ෂේත්‍ර දෙකක පුහුණුවක් සහ පර්යේෂණ නිබන්ධනයක් ද සම්පූර්ණ කළ යුතුය. සමාජ වැඩ සඳහා සමාජ විද්‍යාව, සමාජ වැඩ සඳහා මනෝවිද්‍යාව, සමාජ වැඩ පිළිබඳ දර්ශනය, ශ්‍රී ලාංකික සමාජය අවබෝධ කර ගැනීම, ශ්‍රී ලංකාවේ සමාජ සුභසාධන වැඩසටහන්, ගෝලීයකරණය සහ සමාජ සුභසාධනය, සමාජ වැඩ සහ මානව හිමිකම්, සමාජ වැඩ කළමනාකරණය, සමාජ ප්‍රතිපත්තිය, සමාජ වැඩ සඳහා පර්යේෂණ ක්‍රම මෙන්ම මූලික ක්ෂේත්‍ර පුහුණුව සහ ප්‍රජා වැඩ වැනි විෂයයන්; සහ පර්යේෂණ නිබන්ධන සහ ප්‍රායෝගික දැනුම සහ කුසලතා ලබා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දී ඇත.

මෙම වැඩසටහන SLQF අනුව නිර්මාණය කර ඇති අතර ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව ලකුණු ලබා දී ඇත. එබැවින්, අපගේ ආයතනයේ සමාජ වැඩ පිළිබඳ පශ්චාත් උපාධිය සම්පූර්ණ කළ සිසුන්ට විදේශයන්හි රැකියා සඳහා ඉහළ අවස්ථාවන් ඇත.

## සමාජ වැඩ උපාධිය




(වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය - 2024)

ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් පවත්වනු ලබන සමාජ වැඩ පිළිබඳ උපාධි වැඩසටහනේ අරමුණ වන්නේ සමාජ වැඩ වටිනාකම් පිළිබඳ හොඳ අවබෝධයක් ඇති, සමාජ සුභසාධන සේවා කළමනාකරණය කිරීමට හැකියාව ඇති, ගුණාත්මක තත්ත්වයේ ඉගැන්වීම් සහ පර්යේෂණවල නිරත වීමට සහ බහු වාර්ගික ශ්‍රී ලංකාවක් තුළ සාමය හා සමගිය ප්‍රවර්ධනය කිරීමට හැකියාව ඇති වෘත්තීය සමාජ සේවකයින් බිහි කිරීමයි. සමාජ වැඩ පිළිබඳ උපාධිය වසර 4 ක පූර්ණ කාලීන පාඨමාලාවකි. එය සමාසික 08 කින්, පන්ති කාමර දේශනවලින් සහ ක්ෂේත්‍ර අධ්‍යයනය කිරීම් වලින් සමන්විත වේ.

සමාජ වැඩ පිළිබඳ ගෞරව උපාධිය පූර්ණ කාලීන සිව් අවුරුදු වැඩසටහනක් වන අතර, සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාවට සමාන පළමු වසර, සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමාවට සමාන දෙවන වසර සහ සංශෝධිත විෂයමාලා සමඟ ප්‍රතිසංස්කරණය කරන ලද 3 වන සහ 4 වන වසර සමාජ වැඩ පිළිබඳ ගෞරව උපාධිය ලෙස ක්‍රියාත්මක වේ.

විශේෂයෙන්ම සමාජ වැඩ පිළිබඳ උපාධිය අද්විතීය වැඩසටහනක් වන්නේ එය ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්ව විද්‍යාල විසින් පිරිනමනු ලබන වෙනත් ඕනෑම සමාජීය විද්‍යා උපාධි පාඨමාලාවක් මෙන් නොව න්‍යායාත්මක දැනුම පමණක් නොව ප්‍රායෝගික පුහුණුවක් ද ලබා දෙන බැවිනි. පන්ති කාමර දේශන අතරතුර, සිසුන් තම දැනුම සහ ආකල්ප වෙනස් කිරීම සඳහා ක්ෂේත්‍ර පුහුණුවට සම්බන්ධ කරනු ලබන අතර, ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් නියෝජිතායතන, ක්ෂේත්‍ර සහ පීඨ අධීක්ෂකවරුන්ගේ මග පෙන්වීම සහ අධීක්ෂණය යටතේ පවත්වනු ලැබේ. මෙම උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය සමාජීය විද්‍යා විෂයයන් මෙන්ම සමාජ වැඩ පිළිබඳ නිශ්චිත පාඨමාලා වලින් සමන්විත වන අතර සිසුන්ට පුළුල් දැනුමක් ලබා දෙයි. ක්ෂේත්‍ර පුහුණුව හරහා පුද්ගලයින්, පවුල්, සමාජ කණ්ඩායම්, සංවිධාන සහ ප්‍රජා ක්‍රියාකාරකම්වල නිරත වීම සහ එම ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා සකස් කිරීම ද සිසුන්ට අනිවාර්ය වේ. ඊට අමතරව, සිසුන් පර්යේෂණ සිදු කොට, සොයාගැනීම් මත පදනම්ව ක්‍රියාකාරකම් සැලසුම් කර දියත් කළ යුතු අතර පර්යේෂණ වාර්තාවක් සකස් කළ යුතුය.

# උපාධිධාරීන් සඳහා රැකියා අවස්ථා

## රාජ්‍ය අංශයේ රැකියා

- සමාජ වැඩ කථිකාචාර්ය - වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය
- සමාජ වැඩ උපදේශක - වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය
- රේගු නිලධාරීන්
- සංවර්ධන සහකාර
- පරිවාස නිලධාරීන්
- ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධාරීන්
- ජාතික ළමා ආරක්ෂණ නිලධාරීන්
- කාන්තා සංවර්ධන නිලධාරීන්
- උපදේශකයින්
- ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපන සේවය
- මනෝචිකිත්සක සමාජ වැඩ උපදේශක

## රාජ්‍ය නොවන අංශය

සමාජ වැඩ වෘත්තිකයන්ට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විශාල ඉල්ලුමක් පවතී.

ඒ අනුව, අපගේ ආයතනයෙන් උපාධිධාරීන් සඳහා පහත සඳහන් රැකියා අවස්ථා තිබේ.

- ව්‍යාපෘති කළමනාකරු / වැඩසටහන් සම්බන්ධීකාරක
- වැඩසටහන් නිලධාරීන්
- උපදේශක / වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී
- අධීක්ෂණ සහ ඇගයීම් නිලධාරීන්
- ක්ෂේත්‍ර නිලධාරීන්

## පෞද්ගලික අංශය

- සමාජ වගකීම් සම්බන්ධීකාරක
- උපදේශක
- මානව සම්පත් කළමනාකරු / නිලධාරීන්

එමෙන්ම NORAD, AUS-AID, Common Wealth සහ ඉන්දියානු රජයේ ශිෂ්‍යත්ව වැනි විදේශ ශිෂ්‍යත්ව ලබාගත් සිසුන් උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා විදේශගත වී ඇත. මෙම සිසුන්ට ජාත්‍යන්තරව ඉහළ ඉල්ලුමක් පවතින අතර ඔවුන්ට ඉහළ මට්ටමේ රැකියා අවස්ථා තිබේ.

**විෂය බාහිර ක්‍රියාකාරකම්**




2024 මාර්තු 19 වන දින සමාජ වැඩ දිනය **"Share Future for Transformative Change"**














ලෝක සමාජ වැඩ දිනය වාර්ෂිකව මාර්තු මාසයේ තුන්වන අඟහරුවාදා සමරනු ලැබේ. මෙම දිනය සමාජ වැඩ වෘත්තිකයන්ගේ දායකත්වය හඳුනා ගැනීමට සහ සැමරීමට, සමාජවල අනාගතය හැඩගැස්වීමේදී සමාජ සේවාවන්හි වැදගත්කම ඉස්මතු කිරීමට සහ සමාජ සාධාරණත්වය සහ මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටීමට ගෝලීය වේදිකාවක් ලෙස කටයුතු කරයි. ලොව පුරා සමාජ සේවකයින්ගේ කැපවීම, වෘත්තීයභාවය සහ බලපෑම ද එහිදී සාකච්චා කරයි.

මෙම අවස්ථාවේදී, සමාජ වැඩ සංවිධාන ක්ෂේත්‍රයේ ගුණාත්මක භාවිතයන් ප්‍රවර්ධනය කිරීමට, දැවෙන සමාජ ගැටළු පිළිබඳව දැනුවත් කිරීමට සහ අවදානමට ලක්විය හැකි ජනගහනයන්ට සහාය වන ප්‍රතිපත්ති සඳහා සටන් කිරීමට එක්වේ. පුද්ගල සහ සාමූහික අවශ්‍යතා තක්සේරු කිරීම, අත්‍යවශ්‍ය සම්පත් වෙත ප්‍රවේශය පහසු කිරීම සහ අභ්‍යන්තර ශක්තීන් සහ බාහිර ආධාරක පද්ධති හරහා ඔවුන්ගේ අභියෝගවලට මුහුණ දීමට පුද්ගලයින් සහ කණ්ඩායම් බල ගැන්වීම මගින් සමාජ සේවකයින් ප්‍රජාවන් තුළ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. 2024 මාර්තු 19 වන දින, ජාතික සමාජ සංවර්ධන ආයතනයේ (NISD) සමාජ වැඩ පාසල එහි පරිශ්‍රයේ පැවති වැදගත් සිදුවීමක් සමඟ ලෝක සමාජ වැඩ දිනය සැමරීය. මෙම වසරේ තේමාව වන Share “Future for Transformative Change" ධනාත්මක සමාජ පරිණාමය පෝෂණය කිරීමේදී සාමූහික ක්‍රියාකාරිත්වයේ ගෝලීය වැදගත්කම අවධාරණය කළේය.

මෙම සැමරුමට ක්ෂේත්‍රයේ ගෞරවනීය සංවිධාන සහභාගී වූ විවෘත දින වැඩසටහනක් ඇතුළත් විය. සමාජ සේවා දෙපාර්තමේන්තුව, වැඩිහිටි ජාතික ලේකම් කාර්යාලය, කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ උපදේශන අංශය, ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය, සමාජ ආරක්ෂණ මණ්ඩලය, ජාතික මානසික සෞඛ්‍ය ආයතනය, SERVE, පවුල් සැලසුම් සංගමය, MAS හෝල්ඩින්ග්ස්, SAPSRI, සිලෝන් මෙඩෙක්ස්ප්ලෝර් පුද්ගලික සමාගම සහ ශ්‍රී ලංකා වෘත්තීය සමාජ සේවකයින්ගේ සංගමය යන ආයතන මෙම අවස්ථාවට සහභාගී වූ කැපී පෙනෙන පුද්ගලයින් අතර විය.

මෙම අවස්ථාව අතරතුර, මෙම සංවිධානවල නියෝජිතයින් NISD හි ශිෂ්‍ය ප්‍රජාව සමඟ වටිනා අවබෝධයන් සහ වෘත්තීය අත්දැකීම් බෙදා ගත් අතර, සමාජ වැඩ භාවිතය සහ එහි පරිවර්තනීය විභවය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය පොහොසත් කළහ.


**මානව ජනාවාසවල සේවා සැපයීම පිළිබඳ වැඩසටහන 2024**











2024

National Institute of Social Development (NISD)
Bachelor of Social Work – 2020/2021
MINISTRY OF WOMEN, CHILD AFFAIRS AND SOCIAL EMPOWERMENT
Service Delivery in Human Settlements - Rural Camp

Kolonna DivisionalSecretariat,
Rathnapura District
22/07/2024

BSW 2020/2021 කණ්ඩායමේ තුන්වන වසරේ සිසුන් විසින් සිදු කරන ලද ග්‍රාමීය කඳවුර ජූලි 22 සිට අගෝස්තු 1 දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී සාර්ථකව පවත්වන ලදී. මෙම ක්ෂේත්‍ර පාදක වැඩසටහන කොළොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බල ප්‍රදේශය යටතේ ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාශ 29ම ආවරණය කර සිසුන්ට සැබෑ ගෝලීය ඉගෙනුම් අත්දැකීමක් ලබා දුන්නේය.

කඳවුරේ කොටසක් ලෙස, සිසුන් දින 10 ක අඛණ්ඩ කාලයක් නේවාසික ක්ෂේත්‍ර සැකසුම්වල තබා ඇති අතර, එම කාලය තුළ ඔවුන් පුළුල් ප්‍රජා තක්සේරු කිරීම් සිදු කළ අතර පදිංචිකරුවන් සහ ප්‍රාදේශීය කොටස්කරුවන් සමඟ සෘජුව අන්තර් ක්‍රියා කළහ. මෙම කටයුතු හරහා, ප්‍රජාවන්ට බලපාන සමාජ, ආර්ථික සහ සේවා ආශ්‍රිත ගැටළු රාශියක් හඳුනා ගැනීමට සිසුන්ට හැකි විය. රාජ්‍ය සේවා සැපයීමේ හිඩැස් හඳුනා ගැනීම, පවතින රජයේ සේවාවන් පිළිබඳව ජනගහනය අතර ඇති සීමිත දැනුවත්භාවය සහ ප්‍රජාව සහ පරිපාලන නිලධාරීන් අතර සම්බන්ධීකරණය හා සන්නිවේදනයේ සැලකිය යුතු ඌනතාවයක් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී. මෙම ප්‍රායෝගික අත්දැකීම සමාජ වැඩ සම්බන්ධයෙන් සිසුන්ගේ ප්‍රායෝගික නිපුණතා වැඩිදියුණු කළා පමණක් නොව, කලාපය සඳහා අනාගත මැදිහත්වීම් සහ ප්‍රතිපත්ති නිර්දේශ ලබා දිය හැකි වටිනා අවබෝධයක් ජනනය කිරීමට ද දායක විය.

**සමාජ සේවා විද්‍යාලය විසින් භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් පවත්වන ලද අධ්‍යන වැඩසටහන්**

| අනු අංකය | පාඨමාලාවේ නම, මාධ්‍ය හා ස්ථානය | සහභාගී වූ සිසුන් සංඛ්‍යාව | පාඨමාලාවේ ප්‍රගතිය | පාඨමාලාවේ මූල්‍ය ප්‍රගතිය (2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා) | |
|---|---|---|---|---|---|
| | | | | ආදායම | වියදම |
| 01 | සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (ඉංග්‍රීසි) 2018/2019 (සීදුව) | 42 | උපාධි ප්‍රදානෝත්සවය පවත්වා ඇත. | | |
| 02 | සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) 2019/2020 (සීදුව) | 86 | උපාධි ප්‍රදානෝත්සවය පවත්වා ඇත. | | |
| 03 | සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (2020/21) සිංහල, දෙමළ, ඉංග්‍රීසි | 157 | හතරවන වසර පළමු සමාසික විභාගය පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත. | 5.8 | 5.8 |
| 04 | සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (2021/22) සිංහල, දෙමළ, ඉංග්‍රීසි | 403 | තෙවන වසර පළමු සමාසිකයේ පන්ති කාමර දේශන පැවැත්වේ. | | |
| 05 | සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (2022/23) සිංහල, දෙමළ, ඉංග්‍රීසි | 183 | දෙවන වසර පළමු සමාසිකයේ පන්ති කාමර දේශන පැවැත්වේ. | | |
| 06 | සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (2023/24) සිංහල, දෙමළ, ඉංග්‍රීසි | 165 | පළමු වසර පළමු සමාසිකයේ පන්ති කාමර දේශන පැවැත්වේ. | | |
| 07 | ශිෂ්‍ය සුභසාධන කටයුතු | 360 | ආයතනික ශිෂ්‍යාධාර ලබා දී ඇත. | 7.0 | 7.0 |
| 08 | උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීම (2023) | 128 | 2024 දෙසැම්බර් මස පවත්වන ලදී. | 0.20 | 0.20 |

**සමාජ සේවා විද්‍යාලය මඟින් මුදල් අයකර පවත්වන ලද අධ්‍යාන වැඩසටහන්**

| අනු අංකය | පාඨමාලාවේ නම, මාධ්‍ය හා ස්ථානය | සහභාගි වූ සිසුන් සංඛ්‍යාව | පාඨමාලාවේ ප්‍රගතිය | පාඨමාලාවේ මූල්‍ය ප්‍රගතිය (2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා) | |
|---|---|---|---|---|---|
| | | | | ආදායම | වියදම |
| 01 | සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) 2021/22 (සීදූව) | 67 | දෙවන වසර දෙවන සමාසිකයේ පර්යේෂණ ව්‍යාපෘති | | |
| 02 | සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) 2022/23 (සීදූව) | 150 | පළමු වසර දෙවන සමාසිකයේ පන්ති කාමර දේශන පවත්වයි. | 17.05 | 12.96 |
| 03 | සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව මාලාව (සිංහල) 2022/23 (සීදූව) | 30 | පළමු වසර දෙවන සමාසිකයේ ක්ෂේත්‍ර කටයුතුවල නිරත වී සිටි. | | |

# පුහුණු අංශය




(වාර්ෂික ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය - 2024)

## හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ආයතනික ව්‍යුහයේ ප්‍රධාන අංශ හතර අතුරින් එකක් වන පුහුණු අංශය 2004 වර්ෂයේ දී ස්ථාපනය කරන ලදී. පුහුණු  අංශය අධ්‍යක්ෂක (පුහුණු) යටතේ ක්‍රියාත්මක වන අතර ජ්‍යෙෂ්ඨ පුහුණු කිරීමේ නිළධාරිනියන් දෙදෙනෙකු සහ පළමු ශ්‍රේණියේ පුහුණු කිරීමේ නිළධාරීන් / නිළධාරින් 06 දෙනෙකු මෙම අංශය තුළ සේවය කරනු ලබයි. මීට අමතරව කළමණාකාර සහකාර I නිළධාරිනියන් දෙදෙනෙකු සහ කාර්යාල කාර්ය සහායකවරියක මෙම අංශයට අනුයුක්තව සේවය කරයි.

සමාජ සුභසාධන ක්‍රම සහ සමාජ සංවර්ධන වැඩසටහන් පිළිබඳ අධ්‍යයන කටයුතු පැවැත්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීමසමාජ වැඩ වලදී තාක්ෂණය උපයෝගී කරගැනීම ඇතුලුව සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපන ක්‍රම ,යෙහි නිර්මාණාත්මක පරිචයක් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ,ඒ හා සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම හා සමාජ සුභසාධනයෙහි නිරත නිළධරයන් සහ වෙනත් කාර්ය මණ්ඩල සඳහා පුහුණුවීමේ පාඨමාලා සහ ශික්ෂණ වැඩසටහන් පවත්වාගෙන යාම 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පුහුණු අංශයට පැවරී ඇති වගකීම් වේ.

පුහුණු අංශය මගින් සංවර්ධනය  ක්ෂේත්‍රයන් හා බැඳුණු  පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර, වෙනත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සඳහා ද පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධනය පිළිබඳ ඉල්ලුම මත පදනම් වූ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම, පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ ප්‍රජා නායකයින්, ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ප්‍රජා සංවර්ධනය පදනම් කරගත් ප්‍රජා පාදක පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධන සම්බන්ධ අධ්‍යයන පාඨමාලා හඳුන්වා දීම සහ පැවැත්වීම පුහුණු අංශය මඟින් සිදු වේ.එසේම පුහුණු කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන හා ඒ ආශ්‍රිත ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් සංවිධානය කරනු ලැබේ. මෙමගින් සිදුකරනු ලබන අධ්‍යයනික කාර්යභාරයන් වඩාත් පුළුල් කරමින් උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව ආරම්භ කිරීමේ අරමුණින් එහි අවශ්‍ය කටයුතු තව දුරටත් සිදුකරමින් පවතී.

පුහුණු අංශය මගින් දීර්ඝ කාලීන සහ කෙටි කාලීන පුහුණු වැඩසටහන් සහ පාඨමාලාවන් මෙන්ම අනෙකුත් වෘත්තීය පාඨමාලා ද සංවිධානය කරනු ලැබේ. එලෙස සංවිධානය කරනු ලබන අධ්‍යයනික පාඨමාලා පහත ආකාර වේ.

උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව, උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව,වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ළමා ආරක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, සමාජ රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, ප්‍රජාපාදක විශෝධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, ළමා පාදක ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව, විශේෂ අධ්‍යාපනය ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව හා සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව වේ.

මෙම වැඩසටහන් සිංහල, ඉංග්‍රීසි හා දෙමළ යන මාධ්‍ය ත්‍රිත්ත්වයෙන් ම පැවැත්වීමේ හැකියාව පවතින අතර, අදාළ අධ්‍යයනික වැඩසටහනට පවතින ඉල්ලුමට අනුව භාෂා මාධ්‍යය තීරණය කෙරේ. පුහුණු අංශය වෙත ලැබෙන ඉල්ලුම මත පදනම්ව පහත ආකාරයේ කෙටිකාලීන පුහුණු වැඩසටහන් ද සංවිධානය කරනු ලැබේ.

උපදේශන මැදිහත්කරණ ක්‍රමශිල්ප, විශෝධන සේවා හා බැඳුනු උපදේශනය, මත්ද්‍රව්‍ය සඳහා උපදේශනය, මෘදු කුසලතා, සිද්ධි කළමනාකරණය සඳහා මූලික කුසලතා, පවුල් සමඟ වැඩ කිරීම සඳහා මූලික කුසලතා, කණ්ඩායම් සමඟ වැඩ කිරීම සඳහා මූලික කුසලතා, ප්‍රජාව සමඟ වැඩ කිරීම සඳහා මූලික කුසලතා, නායකත්වය, ගැටුම් කළමනාකරණය, සතුටු පවුල, උපදේශනය තුළ තක්සේරුකරණය, ආතතිය සහ මනෝවිද්‍යාත්මක උපදේශනය, අනපේක්ෂිත ගැබ්ගැනීම් සහ උපදේශනය, සමාජ හිංසාව කළමනාකරණය කිරීම, සමාජ රැකවරණය, වැඩ පරිසරය සහ සාමාන්‍ය ජීවිතය සමබර කරගැනීම සඳහා ජීවන කුසලතා, ළමා සංවර්ධනය, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වෙනුවෙන් සමාජ වැඩ මැදිහත්කරණය, ව්‍යාපෘති ලිවීම සඳහා වැඩමුලු, ප්‍රජා ව්‍යාපෘති කළමනාකරණය සඳහා වැඩමුලු, වැඩිහිටි රැකවරණය සඳහා උපදේශන මැදිහත්කරණය, දුගීබව අවම කිරීමේ ක්‍රමෝපාය සහ තිරසාර ජීවන සංවර්ධනය, ගැටුම් නිරාකරණය සඳහා ප්‍රජා සංවර්ධනය සහ ප්‍රජා මූල කළමනාකරණය හා ධාරිතාව ගොඩනැවීමේ පුහුණු වැඩසටහන් ඒ අතර වේ.

## 2024 වර්ෂයේදී පුහුණු අංශය මගින් යෝජිත අධ්‍යයන පාඨමාලා

### උපාධි පාඨමාලා

### උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව ආරම්භ කිරීම

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතික පසුබිම තුළ විවිධාකාර ගැටලුවලට පුද්ගලයින් මුහුණපාන අතර, ඒවා විසඳා ගැනීමෙහිලා වෘත්තිය මැදිහත්කරණයක අවශ්‍යතාව මතුව ඇත. එම අධ්‍යයනික අවශ්‍යතාව සාක්ෂාත් කිරීමේ අරමුණින් උපදේශනය පිළිබඳ උපාධි පාඨමාලාව ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු ජාතික සමාජ සංවර්ධන ආයතනය මඟින් සම්පාදනය කරමින් පවතී උපදේශන අධ්‍යාපනයේ කාර්යභාරය හා වගකීම්, වටිනාකම් හඳුනාගැනීම, උපදේශනයේදී පර්යේෂණ හා අධීක්ෂණය සිදු කිරීම හා අවදානම් කණ්ඩායම් හා ආන්තික ජනගහනය සඳහා වෘත්තීය උපදේශන සේවා සැපයීම මෙම උපාධි පාඨමාලාවේ අපේක්ෂිත අරමුණු වේ.

යෝජිත උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාවේ නව විෂයමාලා යෝජනා පත්‍රය ඉදිරිපත් කිරීමෙන් පසු තත්ත්ව සහතික කරන විශේෂඥ කමිටු සාමාජික (SCAQA) නිර්දේශයට අනුව එය තව දුරටත් සකස් විය යුතු ආකාරය පිළිබඳව අදහස් දක්වා ඇත. ඒ අනුව එම සංස්කරණයන් පිළිබඳ ආයතන පරිපාලන උපදෙස් හා මගපෙන්වීම් යටතේ කටයුතු සිදුකෙරෙනු ඇත.

**මානව විද්‍යාව හා වෘද්ධ විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාවන් ආරම්භ කිරීම**

යෝජිත මානව විද්‍යාව හා වෘද්ධ විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාවේ විශයමාලා සංස්කරන කටයුතු තත්ත්ව සහතික කරන විශේෂඥ කමිටු සාමාජිකයින් (SCAQA) පරීක්ෂාවට ලක්කරන ලදි.එම නිර්දේශයන්ට අනුව අවශ්‍ය ඉදිරි කටයුතු ආයතන පරිපාලන උපදෙස් හා මගපෙන්වීම් යටතේ කටයුතු සිදුකෙරෙනු ඇත.





**ඩිප්ලෝමා පාඨමාලා**

**උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**

**හැඳින්වීම**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය විසින් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සති අන්ත අධ්‍යයන පාඨමාලාවක් වශයෙන් පවත්වාගෙන යනු ලැබේ. මෙම පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිකන නිර්දේශයන්ට (SLQF) අනුකූලවන පරිදි සකස්කර ඇත. දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සැකැස්ම සහිත මනා පරිචයන්ගෙන් යුතු වෘත්තීය උපදේශකවරුන් බිහිකිරීම මෙහි ඉලක්කය වේ. උපදේශන ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක බවින් හෙබි වෘත්තිකයන් බිහිකිරීම, උපදේශන වෘත්තිකයන්ගේ වෘත්තීය කුසලතා පුළුල් කිරීම හා උපදේශන වෘත්තිකයාගේ මැදිහත්වීමේ හැකියාව සංවර්ධනය කිරීම පාඨමාලාවේ අරමුණු වේ. සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍ය ත්‍රිත්ත්වයෙන්ම පැවැත්වෙන මෙම පාඨමාලාවේ කාල සීමාව මාස 12 කි. මෙම පාඨමාලාවේ මාස 03ක ක්ෂේත්‍ර පුහුණුවක් අන්තර්ගත වේ. (සති අන්ත පාඨමාලාවකි). පාඨමාලාවේ සම්පූර්ණ සම්මාන ඒකක (Credit) 30කි. දේශන පැය 405 ක් සහ ක්ෂේත්‍ර පුහුණුව පැය 150 කි. ඒ අනුව මුලු පැය ගණන පැය 555 කි. උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව විෂය ඒකක් 09ක්, ක්ෂේත්‍ර පුහුණුව හා අධ්‍යයන චාරිකාව යන අංගයන්ගෙන් සමන්විත වේ.

### ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව

### හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය විසින් ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව සතියේ දින වල මාර්ගගත ක්‍රමය ඔස්සේ (Online) අධ්‍යයන පාඨමාලාවක් වශයෙන් පවත්වාගෙන යනු ලැබේ. මෙම පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිකන නිර්දේශයන්ට (SLQF) අනුකූලවන පරිදි සකස්කර ඇත. ඉංග්‍රීසි භාෂාව ලිවීම, කියවීම හා කථනය හැකියාවන් සහිත මනා පරිචයන්ගෙ බිහිකිරීම මෙහි ඉලක්කය වේ. ඉංග්‍රීසි ලිවීමේදී නිවැරදි ව්‍යාකරණ භාවිතය හා නිවැරදි වචන උච්චාරණය සමාජය තුල භාවිතය සංවර්ධනය කිරීම පාඨමාලාවේ අරමුණු වේ. මෙම පාඨමාලාවේ කාල සීමාව මාස 04 කි. මෙම පාඨමාලාවේ දෛනික පැවැරුම් කිරීම අන්තර්ගත වේ. පාඨමාලාවේ සම්පූර්ණ සම්මාන ඒකක (Credit) 30කි. ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව විෂය එකක් 06කින් සමන්විත වේ.

### 2024 වර්ෂය තුළ උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වූ ස්ථාන

ජාතික සමාජ සංවර්ධන ආයතනය, සීදුව ප්‍රධාන මධ්‍යස්ථානය (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය), තලාව/ කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය, අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානය (සිංහල හා දෙමළ), නුවර (සිංහල හා දෙමළ මාධ්‍ය), කිලිනොච්චිය (දෙමළ මාධ්‍ය), මඩකලපුව (දෙමළ මාධ්‍ය), යාපනය (දෙමළ මාධ්‍යය), ත්‍රිකුණාමලය (දෙමළ මාධ්‍ය).

## කෙටිකාලීන පුහුණු වැඩසටහන්

**පුහුණු අංශය විසින් භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන් හි සාරාංශය පහත පරිදි වේ.**

| අනු අංකය | වැඩසටහන | මධ්‍යස්ථානය | සහභාගීත්වය | සංඛ්‍යාව | වියදම |
|---|---|---|---|---|---|
| 01 | විභාග කටයුතු සම්බන්ධ වගකීම හා කාර්යභාරය දැනුවත් කිරිමේ පුහුණු වැඩසටහන -අධ්‍යන හා අනධ්‍යන | සීදුව | අධ්‍යයන හා අනධ්‍යන කාර්යය මණ්ඩලය | 78 | 32,740.00 |
| 02 | මිලදී ගැනීම් (Procumment) පිළිබඳ පුහුණු වැඩසටහන-අධ්‍යන හා අනධ්‍යන | සීදුව | අධ්‍යයන හා අනධ්‍යන කාර්යය මණ්ඩලය | 65 | 19,680.00 |
| 03 | උපදේශන විෂය මාලා යාවත්කාලීන කිරිම පිළිබඳ පුහුණු වැඩසටහන-අධ්‍යන | සීදුව | අධ්‍යයන කාර්යය මණ්ඩලය | 30 | 19,850.00 |
| 04 | විභාග ප්‍රශ්න පත්‍ර සැකසීම, අධීක්ෂණය හා විභාග කටයුතු මෙහෙයවීම පිළිබඳ පුහුණු වැඩසටහන-අධ්‍යන හා අනධ්‍යන | සීදුව | අධ්‍යයන හා අනධ්‍යන කාර්යය මණ්ඩලය | 58 | 37,830.00 |
| 05 | ප්‍රථම වතාවට හඳුන්වා දුන් ඉංග්‍රීසි පාඨමාලා ප්‍රවර්ධන කටයුතු -ආවරණය වු පළාත් උතුර, උතුරු මැද,නැගෙනහිර.වයඹ හා දකුණ, | සීදුව<br>තලාව<br>අම්පාර<br>කිලිනොච්චිය<br>රන්න | අඩු ආදායම් ලාභි හා අස්වැසුම ලාභි පවුල් වල අ.පො.ස සා.පෙළ සමත් දරුවන්<br>රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන නිලධාරීන්<br>විශ්ව විද්‍යාල සිසුන් | 2,000 | 147,126.00 |
| **එකතුව** | | | | **2231** | **257,226.00** |

**පුහුණු අංශය මගින් නොමිලේ පවත්වන ලද කෙටි කාලීන පුහුණු වැඩසටහන්හි සාරාංශය පහත පරිදි වේ.**

| අනු අංකය | වැඩසටහන | මධ්‍යස්ථානය | සංඛ්‍යාව | වියදම |
|---|---|---|---|---|
| .01 | විභාග කටයුතු සම්බන්ධ නීති රීති පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන | සීදූව | 70 | නොමිලේ පවත්වන ලදී. |
| 02 | වැඩිහිටි ප්‍රජාවගේ මානසික සෞඛ්‍ය ගොඩනැන්වීම පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන | සුවිසුධර්මාරාමය ලියනගේමුල්ල | 250 | නොමිලේ පවත්වන ලදී. |
| 03 | සක්‍රීය සවන් දීම පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල | 75 | නොමිලේ පවත්වන ලදී. |
| | **එකතුව** | | **395** | |

පුහුණු අංශය භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන් සහ පුහුණු අංශය මගින් නොමිලේ පවත්වන ලද කෙටි කාලීන පුහුණු වැඩසටහන් සඳහා සහභාගීත්වය 2626 කි. (2231+ 395 = 2626)

**2024 පුහුණු අංශයේ ගාස්තු අය කිරීමේ උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව, උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන් හා වෙනත් ඩිප්ලෝමා පාඨමලාවන් හි ලද ආදායම**

| අනු අංකය. | පාඨමාලාව | අයකරන ලද ගාස්තුව රු. | සිසුන් ගණන | ආයතනය වෙත මුදල් ලැබීම (රු.) | |
|---|---|---|---|---|---|
| **01** | උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල) 2022/2023 | 76,000.00 | 23 දෙනෙකු ලියාපදිංචි වූ අතර සිසුන් 21 දෙනෙකු පාඨමාලාව හදාරා අවසන් | පාඨමාලා මුදල් 2023 වර්ෂය වන විට ආයතනයට ලැබී අවසන් | |
| 02 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) 2022/2023 2023/2024 2024/2025 | 61,000.00 | 691 දෙනෙකු ලියාපදිංචි වූ අතර සිසුන් 622දෙනෙකු පාඨමාලාව හදාරණු ලබයි. | දෙවන වාරිකය සහ පළමු වාරිකය | 14,260,000.00 |
| 01 | ඉංග්‍රීසි ඩිප්ලෝමාව | 32000.00 | 40 දෙනෙකු ලියාපදිංචි වූ අතර සිසුන් 20 දෙනෙකු පාඨමාලාව හදාරා අවසන් | සම්පූර්ණ පාඨමාලා ගාස්තුව | |
| | | | **මුළු එකතුව** | | **14,260,000.00** |

**2024 පුහුණු අංශය මඟින් මුදල් උත්පාදනය කරන ලද කෙටි කාලීන පුහුණු වැඩසටහන්**

| අනු අංකය. | පාඨමාලාව | අයකරන ලද ගාස්තුව රු. | සිසුන් ගණන | ආයතනය වෙත මුදල් ලැබීම (රු.) |
|---|---|---|---|---|
| 01 | ප්‍රජා විශෝධනය සඳහා සමාජ වැඩ භාවිතය පිළිබඳ දෙදින කෙටිකාලින පුහුණු වැඩ සටහන | 62,500.00 | රත්නපුර දිස්ත්‍රික් ප්‍රජා විශෝධන නිලධාරීන් 62 | 62,500.00 |
| 02 | ප්‍රජා විශෝධනය නිලධාරීන් සඳහා මත්ද්‍රව්‍ය හා සුළු අපරාද වැලැක්වීම පිළිබඳ දෙදින කෙටිකාලින පුහුණු වැඩ සටහන | 67,500.00 | ප්‍රජා විශෝධන නිලධාරීන් 50 | 67,500.00 |
| 03 | ආයතනගත ළමා රැකවරණය පිළිබඳ එක් දින කෙටි කාලින පුහුණු වැඩසටහන | 300,000.00 | පරිවාස ළමා රැකවරණ සේවා නිලධාරීන් 40 | 300,000.00 |
| 04 | නායකත්වය හා සන්නිවේදනය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන - HALO TRUST | 234,375.00 | ප්‍රජා කණ්ඩායම් සඳහා 40 | 234,375.00 |
| 05 | කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා සිව් දින කෙටිකාලීන පුහුණු වැඩසටහන | 150,000.00 | සමාජ සේවා නිලධාරීන් 100 | 150,000.00 |

ඡායාරූප - උපදේශන විෂය මාලා යාවත්කාලීන කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන-අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා





**ඡායා රූප - ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලා සමාරම්භක උත්සවය**






## ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන පිළිබඳ විස්තර

### සමාජවැඩ පුහුණු, පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය, රන්න

### හැඳින්වීම

දකුණු පළාතෙහි හම්බන්තොට දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් 2014.11.05 වන දින ශ්‍රී ආනන්ද හිමි පෙදෙස, අඩි 100 පාර, රන්න යන ලිපිනයෙහි ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජවැඩ පුහුණු,පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය ආරම්භ කරන ලදි. මධ්‍යස්ථානයට ගොඩනැගිලි 02 අයත්වන අතර එහි සිසුන් 50 දෙනෙකුටපහසුකම් සැලසිය හැකි පංති කාමර දේශනශාලා 02ක්, නේවාසික පහසුකම් ලබාගැනිම සඳහා කාමර 03 ක්, කාර්යාල කාමරයක් හා කුඩා සම්මන්ත්‍රණ ශාලාවකින් සමන්විත වේ.

### කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| අනු අංකය | තනතුර | සිටින සංඛ්‍යාව |
|---|---|---|
| 01 | වැඩසටහන් සහකාර / ස්ථානභාර (වැඩ ආවරණ) | 01 |
| 02 | කළමනාකරණ සහකාර | 02 |
| 03 | කාර්යාල කාර්ය සහයක | 01 |

රන්න මධ්‍යස්ථානය 2024 ජුලි මස අවසානයේ සිට වසා දමන ලද අතර ඒ දක්වා කරන ලද වැඩසටහන් විස්තර පහත පරිදි වේ.

**රන්න මධ්‍යස්ථානයේ 2024 වර්ෂයේ නොමිලේ පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන් විස්තර**

| අනු අංකය | දිනය | ප්‍රාකොට්ඨාශය.ලේ. | වැඩසටහන පවත්වන ලද ආයතනය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | 2024.03.15 | තංගල්ල | තංගල්ල කොට්ඨාශයේ පාසල්හි සේවය කරනු ලබන උපදේශන ගුරුවරු සඳහා | 26 |
| 02 | 2024.04.24 | වළස්මුල්ල | වළස්මුල්ල වෘත්තිය පුහුණු අධිකාරියේ ඉගෙනුම ලබන සිසුන් සඳහා | 37 |
| 03 | 2024.04.25 | ඇඹිලිපිටිය | ඇඹිලිපිටිය ජාතික තරුණසේවා සභාවේ නිළධාරින් හා සිසුන් සඳහා | 37 |
| 04 | 2024.04.25 | ඇඹිලිපිටිය | ඇඹිලිපිටිය වෘත්තිය පුහුණු අධිකාරියේ ඉගෙනුම ලබන සිසුන් සඳහා | 34 |
| 05 | 2024.04.26 | තංගල්ල | තංගල්ල ප්‍රා. ලේකම් කාර්යාලයේ ග්‍රාම නිළධාරීන් සඳහා | 22 |
| 06 | 2024.04.26 | තංගල්ල | හ/ සිද්ධාර්ථ මහ විදුහලේ සිසුන් සඳහා | 96 |
| 07 | 2024.04.26 | අඟුණුකොළපැලැස්ස | හ/ මහානාග ජාතික පාසලේ සිසුන් සඳහා | 59 |
| 08 | 2024.05.07 | තංගල්ල | තංගල්ල වෘත්තිය පුහුණු අධිකාරියේ නිළධාරින් හා සිසුන් සඳහා | 51 |
| 09 | 2024.05.07 | තංගල්ල | තංගල්ල NAITA ආයතනයේ ඉගෙනුම ලබන සිසුන් සඳහා | 22 |
| 10 | 2024.05.08 | බෙලිඅත්ත | බෙලිඅත්ත කාර්මික විද්‍යාලයේ සේවයේ නියුතු නිළධාරින් සඳහා | 41 |
| 11 | 2024.05.08 | බෙලිඅත්ත | බෙලිඅත්ත කාර්මික විද්‍යාලයේ ඉගෙනුම ලබන සිසුන් සඳහා | 220 |
| 12 | 2024.05.09 | බෙලිඅත්ත | බෙලිඅත්ත ප්‍රා ලේකම් කාර්යාලයෙය නිළධාරින්. සඳහා | 47 |
| 13 | 2024.05.09 | බෙලිඅත්ත | බෙලිඅත්ත ප්‍රාදේශිය සභාවේ නිළධාරින් සඳහා | 47 |

## සමාජවැඩ පුහුණු, පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය, අම්පාර






### හැඳින්වීම

නැගෙනහිර පළාතෙහි අම්පාර දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් 2013.07.01 වන දින ඩී25, නව නගරය, අම්පාර, යන ලිපිනයෙහි ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජවැඩ පුහුණු,පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය ආරම්භ කරන ලදි. මධ්‍යස්ථානයට ගොඩනැගිලි රජයේ නිල නිවාසයක් නවීකරණය කර බාවිතා කරනු ලබන අතර කාර්යාල කාමර 02 ක්, සිසුන් 30 පමන අසුන් ගැනිමට හැකිවන ලෙස සකසන ලද සාලයක්, දෙදෙනෙකුට නේවාසික විය හැකි නිදන කාමරයකින් ආයතනය සමන්විත වේ.

### කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| අංකය | තනතුර | නිළධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | වැඩසටහන් සහකාර/ස්ථානභාර | 01 |
| 02 | කළමනාකරණ සහකාර | 02 |
| 03 | කාර්යාල කාර්ය සහයක | 01 |

### අම්පාර මධ්‍යස්ථානයේ 2024 වර්ෂයේ නොමිලේ පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන් විස්තර

දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන හා විවිධ සිවිල් සංවිධානයන්ගේ ඉල්ලීම් අනුව නොමිලේ පවත්වන ලද දැනුවත් කිරිම්/කෙටිකාලීන පුහුණු පාඨමාලා වැඩසටහන් 23 මගින් දැනුවත් කරන ලදී. මුළු ප්‍රතිලාභින් ප්‍රමාණය 1361 කි.

| අනු අංකය | දිනය | වැඩසටහන | සම්පත් දායකත්වය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. | 2024.05.13 | ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පාඨමාලා ප්‍රවර්ධනය දමන -ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිලධාරින් | ජාතික සමාජ සංවර්ධන ආයතනය අම්පාර මධ්‍යස්ථානය | 60 |
| 02. | 2024.05.14 | ජාතික ආධුනිකත්ව පුහුණු කිරිමේ ආයතනය - අම්පාර | | 15 |
| 03. | 2024.05.16 | කමල් ෆැටිමා විදයාලයය - කල්මුණ | | 26 |
| 04. | 2024.05.17 | දමන - ප්‍රාදේශිය ලේකම් කාර්යාලයය - යොවුන් සමාජ එකමුතුව | | 45 |
| 05. | 2024.05.21 | ජාතික තරුණ සේවා සභාව - වෘත්තිය පුහුණු මධ්‍යස්තානය - අම්පාර | | 40 |
| 06. | 2024.05.22 | හාඩි කාර්මික විදයාලයය - අම්පාර | | 150 |
| | | | | **336** |

**උපදේශන මධ්‍යස්ථානය මගින් මනෝ විද්‍යා උපදේශන සේවාවන් සැපයීම**

ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක මනෝ විද්‍යා උපදේශන මධ්‍යස්ථානය මගින් 2024 වර්ෂයේ සේවා ලාභින 47 දෙනකු හට උපදේශන සේවාවන් ලබාදෙන ලදී.

| විස්තරය | සේවාලාභින් සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යාපන බාධා/ළමුන්ගේ හැසිරීම් ගැටළු | 13 |
| පවුල් ආරවුල් | 08 |
| මානසික රෝගාබාධ | 07 |
| ආර්ථික ගැටළු ආශ්‍රිත | 05 |
| වෙනත් | 14 |

**සේවාලාභින් යොමු කිරීම්**

01. අම්පාර මහ රෝහලේ මානසික සුවතා ඒකකය

02. ප්‍රාදේශීය රෝහල්

03. පොලිස් ස්ථාන

04. අම්පාර දිසා අධිකරණය

05. ප්‍රාදේශීය ලේකම් කාර්යාල

06. ස්වේච්ඡා ඉදිරිපත්වීම්









## සමාජවැඩ පුහුණු, පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය, තලාව



### හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ තලාව ප්‍රාදේශීය පුහුණු කිරීමේ මධ්‍යස්ථානය උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාෂයේ, මොරගොඩ ග්‍රාමසේවා කොට්ඨාශයේ පිහිටා ඇත. අනුරාධපුර කුරුණෑගල ප්‍රධාන මාර්ගයට මුහුණලා තලාව නගරයේ සිට කි.මී. 2 පමණ අනුරාධපුර නගරයට වන්නට පිහිටා ඇත.

වර්තමානයවන විට තලාව ප්‍රාදේශිය පුහුණු කිරිමේ මධ්‍යස්ථානය සතුව අක්කර 05 ආසන්න භූමියක් සතු වන අතර දෙමහල් ගොඩනැගිල්ලකින් සමන් විත වේ. ප්‍රධාන ගොඩනැගිල්ලේ පහල මහලේ කාර්යාල කාමර 02 ක් හා කුඩා නේවාසික කාමර 02ක් තට්ටු ඇදන් ඇදන් 35 සහිත වෙන් කරන ලද කාමර 02 කින් හා භොජනා ගාරයකින් සමන්විත වේ. ඉහළ මහලේ කුඩා නේවාසික කාමර 02ක් හා VIP කාමර 01 දේශන ශාලාවකින් යුක්ත වේ.

**ආරම්භය**

අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා සමාජ සේවා අමාත්‍ය ගරු බර්ට් ප්‍රේමලාල් දිසානායක මැතිතුමන්ගේ යෝජනාවක් අනුව බණ්ඩාරනායක ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා වන මෙම ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීමේ කටයුතු එතුමාගේ ආරාධනයෙන් ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ගරු කථානායක ආචාර්ය කේ.බි රත්නායක මැතිතුමගේ සහභාගීත්වයෙන් ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිනි අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරණායක කුමාරතුංග මැතිනිය විසින් වර්ෂ 1999 ක් වූ පෙබරවාරි මස 26 වෙනි දිනට යෙදුන සුභ මොහොතින් මුල්ගල තබා ආරම්භ කරන ලදී.

**ආරම්භ කිරීමේ අරමුණු**

2002 මාර්තු මස 31 වන දින සමාජ සුභසාධන අමාත්‍ය ගරු රවින්ද්‍ර සමරවීර මැතිතුමා අතින් විවෘත කරන ලදී.මෙම තලාව මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණ වූයේ සමජ වැඩ අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණ අංශයෙහි වැඩ මෙම මධ්‍යස්ථානය හරහා ප්‍රදේශයට ලබාදීම සඳහාත් සියලුම දෙනාගේ ජීවන තත්වය ගුණාත්මක මට්ටමින් වර්ධනය කිරීමෙහිලාත් ප්‍රාදේශීය මට්ටමින් සහය ලබාදීම සඳහාත්ය.

**ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ දැක්ම**

සමාජ වැඩ අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණ අංශයෙහි දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විශිෂ්ඨ කේන්ද්‍රස්ථානයේ ශාඛාවක් ලෙස සියලුම දෙනාගේ ජීවන තත්වයන්හි ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා සක්‍රිය කොටස් කරුවෙකු වීම.

**නේවාසික මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ තලාව ප්‍රාදේශිය පුහුණු කිරිමේ මධ්‍යස්ථානය නේවාසික මධ්‍යස්ථානයක් ලෙසද භාවිතා කරනු ලබයි. ප්‍රධාන ගොඩනැගිල්ට අදාලව VIP කාමර 01 (වායු සමනය කළ ) සහ කුඩා කාමර 3 (ඇදන් 03 බැගින්) ඇත. මිට අමතරව 36 දෙනෙකුට නේවාසික පහසුකම් සපයා දිමට හැකිය. මිට අමතරව ප්‍රධාන දේශන ශාලාව (අඩි 60x30) ප්‍රමාණයේ ආසන 80ක් පමණ ඇත.

ආයතනය විසින් නියම කරන ලද මිල ගණන් යටතේ රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශය සඳහා පුහුණු වැඩ සටහන් සඳහා මෙන්ම නේවාසික අවශ්‍යතා සඳහා මධ්‍යස්ථානයේ නේවාසිකාගාර භාවිතා කරණු ලබයි. මේ තුළින් ආයතනයට අමතර ආදායමක් මෙන්ම ජාතික මට්ටමෙන් විශාල සේවයක් සිදු කරණු ලබයි. එමෙන්ම ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ක්ෂේත්‍ර ගත සිසුන්ගේ නේවාසික කටයුතු සඳහා මෙන්ම ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා, පුහුණු වැඩ සටහන් සඳහා නේවාසික කටයුතු ලබාදිය හැකි ආයතනය සතු එකම මධ්‍යස්ථානය වන්නේ තලාව ප්‍රදේශිය ඉගනුම් මධ්‍යස්ථානයයි. තවද ආයතනය මගින් පවත්වන ඩිප්ලෝමා පාඨමාලා, උසස් ඩිප්ලෝමා පාඨමාලා සඳහා දුර බැහැර සිට පැමිණෙන සිසුන් සඳහා නේවාසික පහසුකම් ලබා දිම තුළින් සිසුන් හට මහත් පිටුවහලක් ලැබෙන අතර සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහාද මහත් සම්පතක් බවට ප්‍රාදේශීය මධ්‍යස්ථානය පත්ව ඇත.

## 01. කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර

| අංකය | තනතුර | නිළධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | වැඩසටහන් සහකාර ස්ථානභාර | 01 |
| 02 | කළමනාකරන සහකාර | 02 |
| 03 | කාර්යාල කාර්ය සහයක | 01 |

## සමාජවැඩ පුහුණු, පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය, කිලිනොච්චිය




### හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ කිලිනොච්චි ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය කිලිනොච්චි පැරණි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටා ඇත. එය A9 මාර්ගයට ආසන්නව පිහිටා ඇත. එය දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටා ඇත. ප්‍රධාන ගොඩනැගිල්ලේ කාර්යාලයක්, පන්ති කාමර දෙකක් සහ කුඩා නේවාසිකාගාරයක් ඇත.

### ආයතනයේ කාර්ය මණ්ඩලය

| අංකය | තනතුර | නිළධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ස්ථානභාර නිලධාරී | 01 |
| 02 | කළමනාකරණ සහකාර | 01 |
| 03 | කාර්යාල සහායක | 01 |

### කිලිනොච්චිය මධ්‍යස්ථානයේ 2024 වර්ෂයේ ක්‍රියාත්මක සුහුරු ගම්මාන වැඩසටහන

| අනු අංකය | වැඩසටහන | වැඩසටහන් ගණන | සම්පත්ධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | නායකත්වය පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 50 |
| 02 | වැඩිහිටියන් සඳහා පුහුණු වැඩසටහන | 02 | 50 |

**කිලිනොච්චිය මධ්‍යස්ථානයේ 2024 වර්ෂයේ ක්‍රියාත්මක උපදේශන වැඩසටහන්**

| අනු අංකය | වැඩසටහන | වැඩසටහන් ගණන | සම්පත්ධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | කණ්ඩායම් උපදේශනය | 04 | 50 |
| 02 | මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් සඳහා උපදේශන වැඩසටහන | 05 | 42 |

**කිලිනොච්චිය මධ්‍යස්ථානයේ 2024 වර්ෂයේ ක්‍රියාත්මක වෙනත් වැඩසටහන්**

| අනු අංකය | විෂයය | වැඩසටහන් ගණන | සම්පත්ධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | පාඨමාලා ප්‍රවර්ධන වැඩසටහන් | 01 | 350 |
| 02 | කාන්තා දින වැඩසටහන | 01 | 25 |
| 03 | මානසික සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 01 | 55 |
| 04 | වැඩිහිටියන් හා ළමුන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන | 03 | 100 |

# සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය

## 2024 වර්ෂයේ ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය

| අනු අංකය | ව්‍යාපෘති වැඩසටහන | මූල්‍ය ප්‍රගතිය (රු.) | | |
|---|---|---|---|---|
| | | මුළු මුදල | වියදම් | ශේෂය |
| 01 | සමාජ විද්‍යා ඊ ජර්නල් 2 ක් සහ සමාජ වැඩ ඊ ජර්නල් 02, සමාජ වැඩ පිළිබඳ ශිෂ්‍ය ඊ ජර්නල් 02, පුවත් හසුන් 2ක් ප්‍රකාශයට පත් කිරීම | 130,000.00 | 100,000.00 | 30,000.00 |
| 02 | සමාජ වැඩ පිළිබඳ 3 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය පැවත්වීම. | 500,000.00 | 820,000.00 | |
| 03 | කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන 07 පැවත්වීම. | 450,000.00 | 310,000.00 | 140,000.00 |
| 04. | උපාධිධාරින් සඳහා වන පළමු පර්යේෂණ සම්මන්ත්‍රණය. | 200,000.00 | 180,000.00 | 20,000.00 |
| 05. | වර්තමාන සමාජ ප්‍රශ්න පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය.(දේශගුණික වෙනස්වීම සහ මානසික සෞඛ්‍ය; ශ්‍රී ලංකා සමාජ වැඩ කරුවන්ගේ කාර්යභාරය) | 420,000.00 | 210,000.00 | 210,000.00 |
| 06. | පොත් එළිදැක්වීම සහ බුද්ධිමය කතිකාවත | 300,000.00 | - | 300,000.00 |
| | එකතුව | 2,000,000.00 | 1,620,000.00 | 380,000.00 |

### අංශයේ අරමුණ

සමාජ වැඩ, සමාජ සුබසාධන හා සමාජ සංවර්ධන විෂය ක්ෂේත්‍රය හා අදාළ විවිධ පර්යේෂණ හා අධ්‍යයන සිදු කිරීමත්, ඒ ආශ්‍රිත පර්යේෂණ වාර්තා හා ශාස්ත්‍රීය සංග්‍රහ ප්‍රකාශයට පත් කිරීමත්, පුළුල් වශයෙන් ශ්‍රී ලංකාවේ සමාජ සුබසාධන හා සංවර්ධන විෂය ක්ෂේත්‍රයට අදාළ සමාජ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දායකත්වය ලබා දීම සඳහා කටයුතු කිරීම.

### පර්යේෂණ අංශයේ කාර්යභාරය


- සමාජ පර්යේෂණ හා සමීක්ෂණ ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම හා සමාජ වැඩ හා සමාජ ප්‍රතිපත්තීන් සම්පාදනයට අවශය සැලසුම් සකස් කිරීම
- සමාජ පර්යේෂණවල නිරත වෙමින් පවතින සමාජ ගැටලු කෙරෙහි අවධානය යොමු කරමින් රාජය ප්‍රතිපත්ති හා විවිධ ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම
- අදාළ අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය ඇති කරමින් වරප්‍රසාද අහිමි පවුල් සඳහා අවශ්‍ය වන පහසුකම් හා සේවා ලබා ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා දීම
- රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, සංවිධාන සමඟ ඒකාබද්ධ වී පර්යේෂණ දියත් කිරීම ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රමවේදයන් මඟින් පර්යේෂණයන් සිදු කිරීම
- පර්යේෂණ යෝජනා පත්‍ර සකස් කිරීම, ඉදිරිපත් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම හා පර්යේෂණ වාර්තා සකස් කිරීම
- ක්ෂේත්‍රයට ගොස් තොරතුරු එකතු කිරීම හා ඒවායේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම
- සමාජ පර්යේෂණවලට අදාළ දත්ත බැංකුවක් පවත්වා ගෙන යාම

**පර්යේෂණ අංශය මඟින් ප්‍රකාශයට පත්කරනු ලබන ශාස්ත්‍රීය ප්‍රකාශන**

### ශ්‍රී ලංකා සමාජ වැඩ සඟරාව (Sri Lanka Journal of Social Work)


සමාජ වැඩ විෂය මෙරට තුළ තවමත් ජනප්‍රිය විෂයක් නොවුණ ද වර්තමානය වන විට මෙම විෂයේ අවශ්‍යතාවය මතු වෙමින් පවතී. එබැවින් සමාජ වැඩ විෂයීය දැනුම සමාජගත විද්‍යාර්ථයින් තුළ වර්ධනය කිරීම සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය මඟින් අර්ධ වාර්ෂිකව ශ්‍රී ලංකා සමාජ වැඩ සඟරාව ප්‍රකාශයට පත් කරනු ලබයි. මෙම සඟරාව මඟින් සමාජ වැඩ පර්යේෂණ හා ශාස්ත්‍රීයකරණයේ නිරත පර්යේෂකයන්ට හා විද්‍යාර්ථයින්ට ඔවුන් රුචිකත්වයක් දක්වන පර්යේෂණ හා ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රය අවශ්‍ය නවාංගයන් හඳුන්වා දීමට මෙන්ම සමාජ වැඩ විෂයෙහි ප්‍රගමනය උදෙසා මාර්ගෝපදේශන සපයාදීමක් සිදු කරයි.

2024 වර්ෂයේ ප්‍රකාශයට පත් කරන ලද මෙම සඟරාවේ මූලික තේමාව වූයේ **"පරිවර්තනීය වෙනසක් සඳහා බෙදාගත් අනාගතයක්" (Shared Future for Transformative Change)** වේ. භාෂා ත්‍රිත්වයෙන්ම සමාජ වැඩ පර්යේෂණාත්මක පත්‍රිකා අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ලැබේ. ශ්‍රී ලංකා සමාජ වැඩ සඟරාව සංශෝධිත විමර්ශිත ජර්නලයක් (Peer Reviewed) ලෙස ප්‍රකාශයට පත් වන අතර මෙම ප්‍රකාශනය අන්තර් ජාතික ජර්නල් ප්‍රමිතියට අනුව සම්පාදනය කර ඇත. සමාජ වැඩ විෂය ක්ෂේත්‍රයට අදාළ විෂය ප්‍රාමාණික විමර්ශිත මණ්ඩලයක් මඟින් සෑම පර්යේෂණ පත්‍රිකාවක්ම ද්විත්ව විමර්ශනයට ලක් කරයි.





### ශ්‍රී ලංකා සමාජීය විද්‍යා සඟරාව (Sri Lanka Journal of Social Sciences)

සමාජීය විද්‍යා සඟරාව බහුවිධ ශික්ෂණික ශාස්ත්‍රීය ජර්නලයක් ලෙස ප්‍රකාශයට පත්වන අතර අර්ධ වාර්ෂික ප්‍රකාශයක් වේ. සමාජීය විෂයන්ගේ බහුබ සංකලිත ප්‍රකාශනයන් අන්තර්ගත වන අතර පර්යේෂණ හා ශාස්ත්‍රීය ලේඛනයන් සඳහා පර්යේෂකයන්ට හා ශාස්ත්‍රඥයන්ට අවකාශ ලබා දී ඇත. අර්ධ වාර්ෂික සඟරාවක් ලෙස ප්‍රකාශයට පත්වන මෙම ජර්නලය මඟින් සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍රයට නවාංගයන් සමාජගත කිරීමට අවශ්‍ය කාර්යභාරය සකස් කරනු ලබයි. සමාජීය විද්‍යා විෂයෙහි ප්‍රගමනය හා නවීන පර්යේෂණ සාහිත්‍යයක් සමාජගත කිරීමට අවශ්‍ය කාර්යභාරය සකස් කිරීම අරමුණු කර ගත් මෙම ජර්නලය මඟින් පර්යේෂණ ක්ෂේත්‍රයේ යෙදෙන දේශීය හා විදේශීය පර්යේෂකයන්ට මෙන්ම ශාස්ත්‍රෝග්‍රහනයේ නිරත ශාස්ත්‍රඥයින්ට තම විෂය පථයට අදාළ ශාස්ත්‍රීය ලේඛණකරණයේ නිරත වීමටත් ඒවා ප්‍රකාශයට පත් කර ගැනීමටත් අවශ්‍ය කාර්යභාරය සකස් කර දී තිබීම සුවිශේෂී කාර්යයක් වේ.




### සමාජ වැඩ ශිෂ්‍ය සඟරාව (Student Journal of Social Work)

සමාජ වැඩ ශිෂ්‍ය සඟරාව 2024 වර්ෂය සඳහා සමාජ වැඩ ක්ෂේත්‍රයේ විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ ශාස්ත්‍රීය කතිකාවතක් ගොඩනැගීම සඳහා සමාජ වැඩ උපාධි අපේක්ෂිකයින්ගේ ශාස්ත්‍රීය ලිපි ප්‍රකාශයට පත්කෙරේ. වාර්ෂික සමාජ වැඩ ශිෂ්‍ය සඟරාව, ප්‍රජා සංවර්ධනය සඳහා සමාජ වැඩ මැදිහත්වීම යන තේමාව යටතේ ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය පදනම් කර ගනිමින් ශාස්ත්‍රීය හා පර්යේෂණ ලිපි ප්‍රකාශයට පත්කර ඇත. ශාස්ත්‍රීය කුසලතාව ඇති කිරීම සඳහා ඔවුනොවුන්ගේ එක් එක් විෂය මූලිකව සුවිශේෂායනය වී ඇති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ගොඩනගාගත් දැනුම හුවමාරු කර ගැනීම මඟින් ශ්‍රී ලාංකීය සමාජ සන්දර්භයේ සමාජ වැඩ දැනුම සමාජගත කිරීම අරමුණුගතව සම්පාදිත මෙම ශාස්ත්‍රීය ප්‍රකාශනය ජාතික සමාජ සංවර්ධන ආයතනය මඟින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කෙරේ.




### පුවත්හසුන (Newsletter)

ජාතික සමාජ සංවර්ධන ආයතනය මඟින් වාර්ෂිකව පුවත් හසුන ප්‍රකාශයට පත් කරනු ලබයි. ජාතික සමාජ සංවර්ධන ආයතනය පිළිබඳ 2024 වර්ෂයට අදාළ ප්‍රකාශ හා ඉගෙනුම්ගත අධ්‍යාපනික විස්තර ඇතුළත්ව මෙම ප්‍රකාශනය සකස් වී ඇත. පුවත් හසුන තුළ ආයතනයේ සමාජ සේවා විද්‍යාලය, පුහුණු අංශය හා පර්යේෂණ හා ප්‍රකාශන යන අධ්‍යයන අංශයන් ත්‍රිත්වයේ හා පාලන හා මුදල් යන ආයතනික අංශවල වර්තමාන තොරතුරු කේන්ද්‍ර කර ගනිමින් ප්‍රකාශයට පත්කර ඇත. ජාතික සමාජසංවර්ධන ආයතනයේ අධ්‍යයන, පර්යේෂණ හා පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම පුවත් හසුනේ ප්‍රධාන අරමුණු වේ.




**කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධන වැඩසටහන - 2024**

පර්යේෂණ හා ප්‍රකාශන අංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. මෙම ඉලක්කගත ක්ෂේත්‍ර පෙරදැරි කරගනිමින් පර්යේෂණ හා ප්‍රකාශන අංශයේ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් කැළණිය විශ්වවිද්‍යාලව මගින් පැවැත්වූ කාර්යමණ්ඩල වැඩසටහන සඳහා සහභාගී විය.

කැලණිය විශ්වවිද්‍යාලය මඟින් සිදුකරනු ලැබූ කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහනෙහි මෙහෙවර වන්නේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන පද්ධතිය තුළ කාර්ය මණ්ඩලයේ පුද්ගල සහ ආයතනික හැකියාවන් ඉහළ නංවන අධ්‍යයන හා පරිපාලන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා සහාය වීමයි. කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහනක් ලබා දීමෙන් විශ්වවිද්‍යාල පද්ධතිය හා වෘත්තීය අධ්‍යයන පරිසරයක් තුළ ඵලදායී ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය කුසලතා සහ නිපුණතා වර්ධනය කිරීමට සහාය වීමක් සිදුවේ. එම අධ්‍යයන/පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉගැන්වීම්හි ඇගයීම්, පර්යේෂණ සහ විෂයමාලා සංවර්ධනය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිතය, පරිපාලනය සහ කළමනාකරණය යන ක්ෂේත්‍රවල නිපුණතා වැඩිදියුණු කිරීම මෙහි අරමුණු වේ.

**සමාජ වැඩ පිළිබඳ උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය (URSSW) – 2024**

ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD) විසින් සංවිධානය කළ URSSW-2024, ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල උපාධි අපේක්ෂකයින්, ගෞරවනීය විද්වතුන් සහ පර්යේෂකයින් සඳහා ඔවුන්ගේ වටිනා අවබෝධය, නවතම පර්යේෂණ සොයාගැනීම්, ක්ෂේත්‍ර ප්‍රායෝගික අත්දැකීම් සහ නව්‍ය අදහස් ඉදිරිපත් කිරීමට සහ බෙදා ගැනීමට අද්විතීය වේදිකාවක් සපයයි. මෙම වාර්ෂික සම්මන්ත්‍රණය, අධ්‍යයන විශිෂ්ටත්වය සහ අදහස් හුවමාරුව, විවිධ දෘෂ්ටිකෝණ සහ පුරෝගාමී පර්යේෂණ පෝෂණය කළ බුද්ධිමය වශයෙන් උත්තේජක පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, විධිමත් අධ්‍යයන රැස්වීමක ප්‍රමිතීන් ආරක්ෂා කරන ලදී.

මෙම පර්යේෂණ සම්මන්ත්‍රණය, උපාධි අපේක්ෂක පර්යේෂකයින්ට සහ ශාස්ත්‍රඥයින්ට ආයතන අතර සම්බන්ධතා ගොඩනැගීමට, නැගී එන පර්යේෂණ අවශ්‍යතාවලට නිරාවරණය වීමට සහ සමාජ වැඩ සහ ඒ ආශ්‍රිත සමාජ විද්‍යාවන්හි මාතෘකා සමඟ ඔවුන්ගේ සම්බන්ධතාවය ගැඹුරු කිරීමට අත්‍යවශ්‍ය අවස්ථාවක් ඉදිරිපත් කෙරුණි. තවද, එය උපාධි අපේක්ෂකයින්ගේ අධ්‍යයන හා වෘත්තීය සංවර්ධනයට සැලකිය යුතු ලෙස දායක විය. සම්මන්ත්‍රණයේ ප්‍රධාන තේමාව :- "අනාගත ලෝකය සඳහා සමාජ වැඩ භාවිතයන් සහ ප්‍රවර්ධනය කිරීම"

කැලණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා අංශයේ ප්‍රධානී ආචාර්ය ප්‍රියන්වදා වනිගසූරිය මහත්මිය "පර්යේෂණවල අනාගතය: AI විසින් ශිෂ්‍යත්වලාභී කාර්යයන්හි පරතරය හඳුනාගැනීම පරිවර්තනය කරන්නේ කෙසේද" යන මාතෘකාව යටතේ ප්‍රධාන දේශනය පැවැත්වූවාය. දැනුමේ හිඩැස් වඩාත් නිරවද්‍ය හා කාර්යක්ෂමව හඳුනා ගැනීමට හැකියාව ලබා දීමෙන් කෘත්‍රිම බුද්ධිය පර්යේෂණ ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් සිදු කරන ආකාරය ඉස්මතු කිරීම මෙම කතිකාවතේ අරමුණ විය. පවතින සාහිත්‍ය සිතියම්ගත කිරීමේදී, ගවේෂණය නොකළ ක්ෂේත්‍ර හඳුනා ගැනීමේදී සහ අධ්‍යයන පර්යේෂණවල සමස්ත ගුණාත්මකභාවය සහ බලපෑම වැඩි දියුණු කිරීමේදී AI මෙවලම් විද්වතුන්ට සහාය විය හැකි ආකාරය එය ගවේෂණය කරන ලදී.

මෙම සම්මන්ත්‍රණය අතරතුර, පහත සඳහන් තාක්ෂණික සැසි තුන යටතේ පර්යේෂණ සාරාංශ 18 ක් ඉදිරිපත් කරන ලදී:

1. තාක්ෂණික සැසිය 01: ග්‍රාමීය සංවර්ධනය, ස්ත්‍රී පුරුෂ භාවය සහ සමාජ අන්තර්ග්‍රහනය කිරීම
2. තාක්ෂණික සැසිය 02: මානසික සෞඛ්‍ය, අධ්‍යාපනය සහ සමාජ වැඩ මැදිහත්වීම්
3. තාක්ෂණික සැසිය 03: ග්‍රාමීය පද්දතිය තුළ සංක්‍රමණය, මත්ද්‍රව්‍ය අනිසි භාවිතය සහ සමාජ ගැටලු

### සමාජ වැඩ පිළිබඳ 3 වන ජාත්‍යන්තර සමුළුව - 2024

ICSW යනු සමාජ වැඩ ක්ෂේත්‍රයේ චින්තන නායකයින් සහ වෘත්තිකයන් එක්රැස් කළ වාර්ෂික සිදුවීමක් විය. අපගේ සමුළුව නව්‍ය ප්‍රවේශයන් ගවේෂණය කිරීමට, දැනුම හුවමාරු කර ගැනීමට සහ ලොව පුරා ප්‍රජාවන් මුහුණ දෙන අභියෝගවලට මුහුණ දීමට අද්විතීය අවස්ථාවක් සපයීය. සහයෝගීතාවයේ බලය අපි විශ්වාස කළෙමු සහ භූගෝලීය සීමාවන් ඉක්මවා යන ජාල පෝෂණය කිරීම අරමුණ කළාය. නව යුගයේ සමාජ ආරක්ෂාව සහ බෙදාගත් පරිවර්තනීය වෙනස කෙරෙහි නිශ්චිත අවධානයක් යොමු කරමින්, ගෝලීය වෘත්තියක් ලෙස සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රීය සංවාදයට පහසුකම් සැලසීම සමුළුවේ අරමුණ විය.

3 වන ජාත්‍යන්තර සමාජ වැඩ සමුළුව - 2024, සමකාලීන සමාජ ගැටළු විසඳීමේදී ගෝලීය සංවාදය, නවෝත්පාදනය සහ සහයෝගීතාවය සඳහා සජීවී වේදිකාවක් ලෙස ක්‍රියා කෙරිණි. *"21 වන සියවසේ සමාජ ආරක්ෂාව: පරිවර්තනීය වෙනස්කම් සඳහා බෙදාගත් හවුල්කාරිත්වය" යන තේමාව යටතේ* , සමාජ සුභසාධනය සඳහා ඇතුළත් සහ තිරසාර ප්‍රවේශයන් ගවේෂණය කිරීම සඳහා විද්වතුන්, වෘත්තිකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් එක්රැස් කිරීමට මෙම සමුළුව දායක විය. ගෝලීය සමාජ වැඩ ක්ෂේත්‍රයේ කීර්තිමත් නායකයෙකු වන ආචාර්ය මචිකෝ ඔහාරා විසින් පවත්වන ලද ප්‍රධාන දේශනය, ගතික අදහස් හුවමාරුවක් සඳහා වේදිකාවක් සකසා දෙන ලදී.

තාක්ෂණික සැසි හය තීරණාත්මක ක්ෂේත්‍ර ආවරණය කෙරිණි.

තාක්ෂණික සැසිය 01: **ආර්ථික අභියෝග සහ සමාජ ආරක්ෂණය**


තාක්ෂණික සැසිය 02: **සමාජ වැඩ සහ ප්‍රජා සංවර්ධනය**

තාක්ෂණික සැසිය 03: **මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම**

තාක්ෂණික සැසිය 04: **දේශගුණික විපර්යාස සහ පාරිසරික ගැටළු**

තාක්ෂණික සැසිය 05: **අධ්‍යාපනය සහ ඩිජිටල් පරිවර්තනය**

තාක්ෂණික සැසිය 06: **සෞඛ්‍ය සහ සමාජ සත්කාර -** නැගී එන ප්‍රවණතා, ප්‍රතිපත්තිමය නවෝත්පාදන සහ ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන විසඳුම් පිළිබඳ ගැඹුරු සාකච්ඡා ඉදිරිපත් කරයි. දැනුම දේශසීමා හරහා පාලමක් ලෙස සම්බන්ධ කිරීමෙන්, වඩාත් සාධාරණ හා ඔරොත්තු දෙන අනාගතයක් හැඩගැස්වීම සඳහා අන්තර් විෂය සහ හරස් අංශ හවුල්කාරිත්වයේ වටිනාකම ICSW-2024 අවධාරණය කෙරිණි.



## තත්ත්ව සහතික මධ්‍යස්ථානය - ජාතික සමාජ සංවර්ධන ආයතනය

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA) තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සිලයේ (QAAC) මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකාවේ ජාතික තත්ත්ව සහතික රාමුවට අනුකූලව තත්ත්ව සහතික ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුව ඇත. ජාතික සමාජ සංවර්ධන ආයතනය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත කරන ලද ප්‍රමුඛ පෙළේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශයට අයත් ආයතනයක් ලෙස තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA) ජාතික ප්‍රතීතන ප්‍රමිතීන්ට අනුකූලව අධ්‍යාපන ප්‍රමිතීන් ඉදිරියට ගෙන යාම සඳහා කැපවී සිටී.

### තත්ත්ව සහතික මධ්‍යස්ථානය මෙහෙවර

අපගේ මෙහෙවර වන්නේ ගුණාත්මක කේන්ද්‍රීය අධ්‍යාපනයක් පවත්වාගෙන යාම සහ සංවර්ධනය කිරීම සහ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ මෙහෙවර හා දැක්මට ගැලපෙන අධ්‍යයන ප්‍රමිතීන් මත පදනම්ව, සියලු ඉගැන්වීම් ඉගෙනුම් සහ ශිෂ්‍ය සහාය සඳහා අඛණ්ඩ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය තිරසාරව පවත්වාගෙන යාමයි.

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ තත්ත්ව සහතික මධ්‍යස්ථානය ආයතනය තුල ඉගැන්වීමේ සහ ඉගෙනීමේ විශිෂ්ටත්වය පෝෂණය කරමින් ගුණාත්මක සංස්කෘතියක් ස්ථාපිත කිරීමට සහ පවත්වාගෙන යාමට කැපවී සිටී. තත්ත්ව සහතික මධ්‍යස්ථානයේදී, අධ්‍යාපනයේ විශිෂ්ටත්වය සහතික කිරීම, අඛණ්ඩ අධ්‍යාපන ප්‍රවර්ධන සංස්කෘතියක් බිහිකිරීම සඳහා අපි කැපවී සිටින අතර, අපගේ ප්‍රධාන අවධානය යොමු වන්නේ ඉගැන්වීමේ, ඉගෙනීමේ, පර්යේෂණවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ අපගේ සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට හොඳම කුසලතා මත පදනම් වූ උසස් අධ්‍යාපන අත්දැකීම් ලබා දීමයි.

### අපගේ අරමුණු

• ආයතනික ක්‍රියා පටිපාටි තත්ත්ව සහතික කිරීමේක්‍රමවේදයන් සහ ජාතික ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම.
• තත්ත්ව සහතික කිරීමේ පිළිවෙත් අඛණ්ඩව භාවිතාව තුල අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම
• ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යාපන වැඩසටහන් සහ සේවාවන්හි නිශ්චිත අවශ්‍යතා සහ අරමුණු වලට අනුකූලව තත්ත්ව සහතික කිරීමේ ක්‍රියා පටිපාටි පවත්වා ගැනීම සහ වැඩි දියුණු කිරීම.
• ආයතනය සඳහා තත්වසහතිකකරණය පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීමෙන් ගුණාත්මක ඉගැන්වීම්, ඉගෙනීම් සහ ගුණාත්මක අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා ආයතනයේ මෙහෙවර සහ අරමුණු සඳහා පහසුකම් සැලසීම.

### තත්ත්ව සහතික මධ්‍යස්ථානයහි කාර්යයන් සහ වගකීම්

• ආයතනය සඳහා තත්වසහතිකකරණය පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීමෙන් ගුණාත්මක ඉගැන්වීම්, ඉගෙනීම් සහ ගුණාත්මක අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා ආයතනයේ මෙහෙවර සහ අරමුණු සඳහා පහසුකම් සැලසීම
• ආයතනය තුළ සියලුම තත්ත්ව සහතිකකරණය ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම
• ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අංශ සහ දෙපාර්තමේන්තු වෙත තත්ත්ව සහතිකකරණය පිළිබඳ උපදෙස් ලබා දීම
• තත්ත්ව සහතිකකරණය පිළිබඳ Cell පිහිටුවීම සහ ඒවායේ රාජකාරි සහ වගකීම් නිර්වචනය කිරීම
• ආයතනයේ සියලුම මට්ටම්වල ධාරිතා වර්ධනය සහ තත්වසහතිකකරණය පිළිබඳ තත්වසහතිකකරණ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සුදුසු පුහුණු සංවිධානය කිරීම.

- ඉගැන්වීම් සහ ඉගෙනුම් තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පවතින ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම
- තත්වසහතිකකරණය පිළිබඳ සමාලෝචන ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය සහ අනෙකුත් තත්වසහතිකකරණය පිළිබඳ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම
- වෙබ්මිතික ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීම සඳහා වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම

2024 දී, ජාතික සමාජ සංවර්ධන ආයතනයේ (NISD) තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) ආයතනික තත්ත්ව සහතිකය ශක්තිමත් කිරීම, අධ්‍යයන කාර්ය මණ්ඩල ධාරිතාව වැඩි දියුණු කිරීම සහ ජාතික උසස් අධ්‍යාපන ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා ප්‍රධාන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. පවත්වන ලද වැඩසටහන් පහත පරිදි දක්වා ඇත.

1. පාර්ශවකරුවන්ගේ උපදේශනය පිළිබඳ වැඩමුළුව - 2024 ජනවාරි 24, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය: නව උපාධි වැඩසටහන් සඳහා ශක්‍යතාව සහ අවශ්‍යතාවය පිළිබඳ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය.

2. තත්වසහතිකකරණය ක්‍රියාවලිය සංවර්ධනය කිරීම පිළිබඳ වැඩමුළුව සහ විශේෂ රැස්වීම - 2024 ජූනි 28, උපායමාර්ගික ක්‍රියාකාරී සැලසුම් සංවර්ධනය කිරීම සඳහා සම්බන්ධ වූ කාර්ය මණ්ඩලය, AAB සහ පාලක මණ්ඩලය.

3. SER ලිවීම, ආයතනික සමාලෝචනය සහ වැඩසටහන් සමාලෝචනය පිළිබඳ වැඩමුළුව - 2024 ජූලි 11, මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද විසින් මෙහෙයවන ලදී: තත්වසහතිකකරණය ක්‍රියාවලීන්හි කාර්ය මණ්ඩල ධාරිතාව ශක්තිමත් කිරීම සහ බාහිර සමාලෝචන අනුකූලතාව.

4. LMS සහ වෙබ් පාදක පහසුකම් පිළිබඳ වැඩමුළුව - 2024 ඔක්තෝබර් 29, NISD: ඩිජිටල් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා ආචාර්ය තරංග රත්නායක විසින් පවත්වන ලදී.

මෙම මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් සඳහා 2024 වර්ෂය වෙනුවෙන් භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් රු. මි. 4.12 ක් වියදම් දරා ඇත.

## ජාතික සමාජ සංවර්ධන ආයතන අරමුදලින් පවත්වන ලද වැඩසටහන්

### තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානය

මෙම මධ්‍යස්ථානය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වලට අමතරව පහත දක්වා ඇති වැඩසටහන් වෙනුවෙන් ජාතික සමාජ සංවර්ධන ආයතන අරමුදලින් රු මි. 7.36 ක්ද වියදම් දරා ඇත.

1. නව උපාධි පාඨමාලා විෂය නිර්දේශ සකස් කර උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම
2. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සිදුකරන ආයතනික සමාලෝචනය සහ ඒ සඳහා ගෙවීම (Institutional Review)සිදුකිරීම.
3. ආයතනය සඳහා නව වෙබ් අඩවිය සකස්කර අවසන් කිරීම.
4. Wing B ගොඩනැගිල්ල ජාලගත කිරීම අවසන් කර ඇත.

### සමාජ වැඩ අධ්‍යයන අංශය

නව පශ්චාත් උපාධි පාඨමාලා ආරම්භ කිරීම සඳහා මෙම අංශය ස්ථාපිත කරන ලද අතර මේ වනවිට ආචාර්ය උපාධි පාඨමාලාවක් , දර්ශන පති උපාධි පාඨමාලාවක් හා ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවක් සඳහා විෂයමාලා සංවර්ධනය කර ඇත. මේ වෙනුවෙන් ජාතික සමාජ සංවර්ධන ආයතන අරමුදලින් රු මි. 0.85 ක් වියදම් දරා ඇත.

**මානව විද්‍යා හා වෘද්ධ විද්‍යා අධ්‍යයන අංශය**

නව උපාධි පාඨමාලා ආරම්භ කිරිම සඳහා ස්ථාපිත මෙම අංශය මගින් මානව විද්‍යා විශේෂ උපාධිය හා වෘද්ධ විද්‍යා විශේෂ උපාධිය සඳහා සංශෝධනය කරන ලද යෝජනා පත්‍ර සකස් කර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. මේ වෙනුවෙන් ජාතික සමාජ සංවර්ධන ආයතන අරමුදලින් රු මි. 0.12 ක් වියදම් දරා ඇත.

**සමාජ විද්‍යා හා සමාජ සංවර්ධන අධ්‍යයන අංශය**

සමාජ විද්‍යා විශේෂ උපාධිය සඳහා සංශෝධනය කරන ලද යෝජනා පත්‍රය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. රු මි. 0.071 ක මුදලක් මේ සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතන අරමුදලින් වියදම් දරා ඇත.

**මනෝවිද්‍යා හා උපදේශනය අධ්‍යයන අංශය**


නව උපාධි පාඨමාලා ආරම්භ කිරිම සඳහා ස්ථාපිත මෙම අංශය මගින් මනෝවිද්‍යා හා උපදේශනය පිළිබඳ උපාධි පාඨමාලාවේ සංශෝධනය කරන ලද විෂය නිර්දේශය SCAQA පැනල මණ්ඩලයට ඉදිරිපත් කර එම නිර්දේශ අනුව නැවත සකස් කර ඉදිරිපත්කර ඇත. මේ සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතන අරමුදලින් රු.මි. 0.133 ක් වියදම් දරා ඇත.

**ශිෂ්‍ය සුභසාධන අංශය**

ශිෂ්‍ය සුභසාධනය උදෙසා 2024 වර්ෂයෙහි ජාතික සමාජ සංවර්ධන ආයතන අරමුදලින් සිසුන් වෙනුවෙන් වැඩමුළු හා වැඩ සටහන් පවත්වන ලදී.

| අනු අංකය | වැඩසටහන | දිනය | සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | යෝගා හා සතිමත්භාවය පිළිබඳ වැඩ සටහන | 2024.11.21 | 100 |
| 02 | පෞරුෂත්ව සංවර්ධන වැඩ සටහන | 2024.12.11 | 100 |
| 03 | අභිප්‍රේරණාත්මක වැඩ සටහන | 2024.12.22 | 100 |

මීට අමතරව ශිෂ්‍ය උපකාරක සේවා මධ්‍යස්ථානයේ අලංකරණය කිරීමද සිදුකරනලද අතර 2024 වර්ෂය සඳහා ශිෂ්‍ය උපකාරක සේවා මධ්‍යස්ථානය වෙනුවෙන් රු.මි.0.134 ක් වියදම් කොට ඇත.












**පෞරුෂත්ව සංවර්ධන වැඩ සටහන**





## විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානය

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ විෂයමාලා සංවර්ධනය සහ සමාලෝචනයට අදාල අනුමත ක්‍රියාවලිය, විෂයමාලා ප්‍රතිපත්ති හා රෙගුලාසිවලට අනුකූලව සිදු කරන බව සහතික කිරීම සඳහා පිහිටුවන ලද ස්ථාවර මධ්‍යස්ථානයකි.

**සංයුතිය**

මෙම මධ්‍යස්ථානය සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය යටතේ ක්‍රියාත්මක වේ.

**කාර්යයන් හා වගකීම්**

1. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් පරිදි සහතික පත්‍ර, ඩිප්ලෝමා හා උපාධි පාඨමාලා වලට අදාල විෂයමාලා සම්බන්ධීකරණය කිරීම.
2. සියලුම නව වැඩසටහන්, පාඨමාලා හෝ පවතින වැඩසටහන් සඳහා සංශෝධන සමාලෝචනය කර තක්සේරු කිරීම සහ නිර්දේශ වාර්තා කිරීම.
3. විෂය මාලාවන්හි යම් වෙනසක් වන්නේ නම්, අවශ්‍ය අවස්ථාවන්හි අදාල අංශ සඳහා උපදේශන සහ සහාය ලබා දීම.
4. විෂයමාලා කරුණු පිළිබඳ අදාල අංශ සහ පාර්ශව කණ්ඩායම් සමඟ සාකච්ඡා කිරීමට සහ අවශ්‍ය අවස්ථාවන්හි ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම.
5. විෂයමාලා සංවර්ධනයේ ප්‍රවණතා සහ අදාළ ප්‍රතිපත්ති අධ්‍යයනය කිරීම.
6. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ වෙබ් පිටුව සමඟ විෂයමාලා සංවර්ධනයන් සන්නිවේදනය කිරීම.
7. අවශ්‍ය අවස්ථාවන්හි, විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානයේ කාර්යයන්, වගකීම්, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි පිළිබඳව උප කමිටු සාමාජිකයින් දැනුවත් කිරීම.
8. පාඨමාලා අත්පොතෙහි විෂයමාලා අන්තර්ගතය සහ අනෙකුත් සියලුම අදාළ විෂයමාලා ආශ්‍රිත දෑ සකස් කිරීමේදී අවශ්‍ය උපදෙස් දීම.
9. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ඇතිව, විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානයේ අරමුණු ඉදිරියට ගෙන යා හැකි විශේෂඥතාව/කුසලතා ඇති ඕනෑම පුද්ගලයෙකු රැස්වීම් සඳහා ආරාධනා කිරීම
10. මධ්‍යස්ථානයේ තීරණවලට අනුකූලව, වාර්තා, නව ආකෘති පත්‍ර, සැකිලි සහ අනෙකුත් අදාළ ලේඛන සකස් කිරීම.
11. නිතිපතා විෂයමාලා මධ්‍යස්ථාන රැස්වීම් පැවැත්වීම.
12. පීඨ මණ්ඩල රැස්වීම්වලදී එවැනි රැස්වීම්වල ප්‍රතිඵල වාර්තා කිරීම

2024 වර්ෂයට අදාලව සමාලෝචනය කරන ලද ප්‍රථම උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලවන් පිලිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

**උපාධි පාඨමාලවන්**

1. සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධිය
2. මනෝවිද්‍යා හා උපදේශන ශාස්ත්‍රවේදී උපාධිය
3. මානව විද්‍යා හා වෘද්ධ විද්‍යා ශාස්ත්‍රවේදී උපාධිය
4. සමාජ විද්‍යා හා සමාජ සංවර්ධන ශාස්ත්‍රවේදී උපාධිය

**ඩිප්ලෝමා පාඨමාලවන්**

5. ඉංග්‍රීසි ඩිප්ලෝමාව

**සහතික පත්‍ර පාඨමාලවන්**

6. සමාජ වැඩ සහතික පත්‍ර පාඨමාලාව
7. ළමා කේන්ද්‍රීය ප්‍රජා සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව
8. උපදේශන සහතික පත්‍ර පාඨමාලාව
9. පර්යේෂණ ක්‍රමවේද හා ශාස්ත්‍රීය ලිවීම සහතික පත්‍ර පාඨමාලාව

ඉහත පාඨමාලාවන්හි විෂය මාලාවන් සමාලෝචනය කොට, ඊට අදාල වාර්තා තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය වෙත යොමු කොට ඇත.

2024.07.31 දින පාලක සභා රැස්වීම් තීරණය අනුව 2023 වර්ෂයේ සිට පැවති විෂයමාලා සංවර්ධන කමිටුව වෙනුවට නව විෂයමාල සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීමට තීරණය කරන ලදී. ඒ අනුව ඒ සඳහා රුපියල් මිලියනයක ප්‍රතිපාදන වෙන් කරන ලදී. එම මුදලින් රුපියල් 650,000.00 වටිනාකමකින් යුතු ලැප්ටොප් (01), මල්ටි මීඩියා (01) හා ඩෙස්ක් ටොප් (01) යන භෞතික සම්පත් මිලදී ගන්නා ලදී.

**පුස්තකාලය**

පුස්තකාල සංවර්ධන වැඩසටහන යටතේ පුස්තකාලය ඩිජිටල්කරණය කිරීමේ මූලික කටයුතු වෙනුවෙන් රු.මි. 0.564 ක් ජාතික සමාජ සංවර්ධන ආයතන අරමුදලින් වියදම් දරා ඇත.

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය**

2024.01.09 වන දින ස්ත්‍රීපුරුෂ සමාජභාවීය අධ්‍යයන කේන්ද්‍රය ආරම්භ කරන ලදි. ආයතනයේ දැක්ම හා මෙහෙවර අනුව ස්ත්‍රීපුරුෂ සමාජභාවීය අධ්‍යයන කේන්ද්‍රයේ වාර්ෂික වැඩ සැලැස්ම පහත පරිදි ක්‍රියාත්මක විය.

1. 2024.02.05 වන දින ස්ත්‍රීපුරුෂ සමාජභාවීය අධ්‍යයන කේන්ද්‍රය සඳහා උපදේශකත්වය ලබා දෙන කැළණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අචාර්ය අනුෂා එදිරිසිංහ මහත්මියගේ මූලිකත්වයෙන් පළමු උපදේශක කමිටු රැස්වීම පවත්වන ලදි.
2. ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ මූලික දැනුම ලබා දීම සඳහා 2024.03.09 වන දින කැළණිය විශ්වවිද්‍යාලයේ ස්ත්‍රීපුරුෂ සමාජභාවීය අධ්‍යයන කේන්ද්‍රය විසින් ආරම්භ කරන ලද The Gender and Cyber Violence Training Workshop සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ස්ත්‍රීපුරුෂ සමාජභාවීය අධ්‍යයන කේන්ද්‍රයේ සිසුන් හා ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් කිහිප දෙනෙකු යොමු කරන ලදි.

3. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අධ්‍යයන කේන්ද්‍රය යටතේ Gender Club ආරම්භ කරන ලද අතර සිසුන් 308 ක් එහි සාමාජිකත්වය ලබා ගනිමින් ස්ත්‍රීපුරුෂ සමාජභාවීය වැඩසටහන් හා පර්යේෂණ සඳහා සම්බන්ධව වැඩ කටයුතු කරනු ලබයි.
4. ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද දෙදින වැඩසටහනෙහි ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ මූලික දැනුම ලබා දීමට අවශ්‍ය සම්පත්දායකත්වය ලබා දෙන ලදි.
5. Foundation for innovative social development විසින් සංවිධානය කරන ලද Empower Women for climate Justice කතිකාවත සඳහා සම්බන්ධ විය.
6. සූරියකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රජාව හා පාසල් සිසුන් ඉලක්ක කර ගනිමින් 2024.07.31 හා 2024.08.01 යන දෙදින ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදි. ඒ සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් කිහිප දෙනෙකු සම්පත්දායකත්වය ලබා දෙන ලදි.
7. ස්ත්‍රීපුරුෂ සමාජභාවීය අධ්‍යයන කේන්ද්‍රය යටතේ Gender Club සාමාජිකත්වය ලබා ගත් සිසුන් විසින් 2024.08.02 වන දින ස්ත්‍රීපුරුෂ සමාජභාවීය පිළිබඳ දැනුවත් කිරීමේ පාසල් වැඩසටහන් ගනේමුල්ල අධ්‍යාපන කලාපය ඉලක්ක කර ගනිමින් පවත්වන ලදි.
8. ස්ත්‍රීපුරුෂ සමාජභාවීය අධ්‍යයන කේන්ද්‍රය සඳහා උපදේශකත්වය ලබා දෙන කැළණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අචාර්ය අනුෂා එදිරිසිංහ මහත්මියගේ සම්පත්දායකත්වයෙන් 2024. 08.13 වන දින ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ වැඩ උපාධිය හදාරනු ලබන පළමු වසර සිසුන් ඉලක්ක කරගනිමින් ස්ත්‍රීපුරුෂ සමාජසමාජභාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.
9. ස්ත්‍රීපුරුෂ සමාජභාවීය අධ්‍යයන කේන්ද්‍රය සඳහා උපදේශකත්වය ලබා දෙන කැළණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අචාර්ය අනුෂා එදිරිසිංහ මහත්මියගේ සම්පත්දායකත්වයෙන් 2024. 12.08 වන දින ජාතික සමාජ සංවර්ධන ආයතනයේ Gender Club සාමාජිකත්වය ලබා ගත් සිසුන් ඉලක්ක කරගනිමින් ස්ත්‍රීපුරුෂ සමාජසමාජභාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

## ලේඛකාධිකාරී අංශය

ලේඛකාධිකාරී අංශය මගින් 2024 වර්ෂයේදී මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ උපාධි සිසුන් 162 ඇතුලත් කර ගැනීම සිදුකර ඇත. එමෙන්ම සමාජ වැඩ උපාධි පාඨමාලාවේ විභාග පැවැතවීම, වාර්ෂික උපාධි ප්‍රධානෝත්සවය පැවැත්වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යයන්වේ. මෙම කාර්යයන් වෙනුවෙන් 2024 වර්ෂයේදී රු.මි.1.5 ක වියදමක් දරා ඇත.

**ආයතනයේ දේශීය පුහුණුවීම් සඳහා සහභාගි වූ නිළධාරීන්**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.මි.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| නිවාඩු ලේඛණ පවත්වාගෙන යාම පිළිබඳ පුහුණුව | 01 | දින 02 | 13,000.00 | | දේශීය | නිවාඩු සම්බන්ධ ලේඛණ පවත්වාගෙන යාම සේවක නිවාඩු නිවැරදිව ගණනය කිරීම සහ නිවාඩු සම්බන්ධයෙන් පැන නැගෙන ගැටලු විසඳාගත හැකි වීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ගබඩා පාලනය පිළිබඳ පුහුණුව | 01 | දින 02 | 13,000.00 | | දේශීය | ගබඩාකරණයේ මූලධර්ම පිළිබඳ දැනුම යාවත්කාලීන වීම, නිවැරදිව පොත් පත් පවත්වාගෙන යාම හා ගබඩා පාලනයේදී පැන නගින ගැටලු අවම කරගැනීමට හැකිවීම |
| වැටුප් පිළිබඳ පුහුණුව (Payroll system ) | 03 | දින 03 | 30,990.00 | | දේශීය | වැටුප් ආශ්‍රිතව පැන නැගී තිබූ ගැටලු බදු අයකිරීම් ආදී ගැටලු නිරාකරණය කරගැනීමට හැකිවීම. |
| කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සහ පුහුණු වැඩසටහන | 13 | | 156,450.00 | - | දේශීය | සේවා කාර්යක්ෂමතාවය හා වැටුප් වර්ධක අත්කරගැනීමේ අවස්ථාව ඉටුවීම. |
| සතිමත්බව භාවනා වැඩසටහන | 50 | එක්දින | - | - | දේශීය | අධ්‍යයන ක්‍රියාවලිය සාර්ථකව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මානසික ඒකාග්‍රතාවය දියුණු කිරීම. |
| තත්ත්ව සහතික කරණ ක්‍රියාවලියේ වැදගත්කම පිළිබඳ එක් දින වැඩමුළුව හා සාකච්ඡාව | අධ්‍යයන කාර්ය මණ්ඩලය 55 | එක් දින | 610,431.00 | | දේශීය | අධ්‍යයන කාර්යමණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පාඨමාලාවන්හි ගුණාත්මක තතත්වය වැඩි දියුණු කරගැනීම තුලින් තත්ත්ව සහතික කරණ මූලධර්ම රැකගැනීම හා ඉගැනුම් කුසලතා වැඩිදියුණු කරගැනීම සඳහා ප්‍රායෝගික කුසලතා වැඩිදියුණු වීම හා ඒ අනුව ක්‍රියාකිරීමට හැකිවීම. |
| අධ්‍යයන අවශ්‍යතාවයක්වූ ආයතනික සමාලෝචනය සහ විෂය සමාලෝචනය පිළබඳ පුහුණු කිරීම | අධ්‍යයන කාර්ය මණ්ඩලය 15 | එක් දින | 2880.00 | | දේශීය | නව අධ්‍යයන පාඨමාලා සඳහා අනුමැතිය ලබා ගැනීමේ වැඩසටහන් සඳහා අවශ්‍ය තත්ත්ව සහතික කරණ ක්‍රියාවලිය පවත්වාගෙන යාම. |
| උගැන්වීම් ක්‍රමවේද සහ අන්තර්ජාල පහසුකම් පිළබඳ දැණුම ලබා දීමේ වැඩසටහන | අධ්‍යයන කාර්ය මණ්ඩලය 29 | එක් දින | 64,475.00 | | දේශීය | නව අධ්‍යාපන ක්‍රමවේද සහ ලෝකයේ භාවිතාවන නව අධ්‍යයන භාවිතයන් පිළිබඳ දැනුම යාවත්කාලීන වීම. |
| ආයතනික සමාලෝචන චාරිකාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | කාර්ය මණ්ඩලය 75 | එක් දින | 37,840.00 | | දේශීය | සමාලෝචන චාරිකා සිදුවූ දිනයන්හිදී එම වැඩසටහන් ඉතා සාර්ථකව සිදුකිරීමට දායකත්වය ලබාදීම. |

# 03. අවසාන ගිණුම් - 2024

**NATIONAL INSTITUTE OF SOCIAL DEVELOPMENT**
**STATEMENT OF FINANCIAL POSITION**
**AS AT 31ST DECEMBER 2024**
*(All amounts are in Sri Lankan Rupees)*

| | NOTE | 2024 | 2023 |
|---|---|---|---|
| **ASSETS** | | | |
| **Current Assets** | | | |
| Inventories | 01 | 1,303,271 | 1,454,025 |
| Prepayments | 02 | 505,004 | 736,559 |
| Staff Debtors | 03 | 12,330,377 | 13,093,816 |
| Receivables & Deposits | 04 | 6,821,217 | 13,440,371 |
| Invesment | 05 | 163,762,968 | 125,214,420 |
| Cash and Cash Equivalent | 06 | 11,635,301 | 23,693,937 |
| | | 196,358,139 | 177,633,129 |
| **Non Current Assets** | | | |
| Property, Plant & Equipment | 07 | 116,014,284 | 143,698,499 |
| **Intangible Assets** | | | |
| Student Information system & Networking | 08 | 3,289,586 | 509,440 |
| | | 119,303,870 | 144,207,939 |
| **Total Assets** | | 315,662,010 | 321,841,068 |
| **EQUITY AND LIABILITIES** | | | |
| **Current Liabilities** | | | |
| Refundable Deposits & Retention | 09 | 2,580,420 | 103,507 |
| Deferred Income (Pre Paid Course Fees ) | 10 | 140,000 | 2,716,500 |
| Accrued Expenses | 11 | 1,548,492 | 1,300,505 |
| | | 4,268,912 | 4,120,512 |
| **Non Current Liabilities** | | | |
| Loan | | | 2,000,000 |
| Employee Benefits | 12 | 35,650,123 | 31,663,462 |
| | | 35,650,123 | 33,663,462 |
| **Total Liabilities** | | 39,919,035 | 37,783,974 |
| **Net Assets** | | 275,742,975 | 284,057,094 |
| **Equity** | | | |
| Accumulated Fund | | 171,680,223 | 196,296,860 |
| Funds for scholership | | | 453,417 |
| Reserves | | 104,062,752 | 87,306,817 |
| **Net Equity** | | 275,742,975 | 284,057,094 |

| බී ඒ එන් පී විජේබණ්ඩාර මිය | 942,425 | 746,075 |
| ඒ එම් මානමුදලි මිය | 411,400 | 324,000 |
| මධුෂානි සිල්වා මිය | 274,525 | 194,063 |
| කේ සී කේ තාබ්‍ර | 359,250 | 194,063 |
| ඒ එච් ඉන්දික සංජීව මයා | 366,125 | 194,063 |
| වසන්ත කුමාර මයා | 740,345 | 611,379 |
| එස් ඒ එස් එන් ප්‍රේමරත්න මයා | 159,345 | 105,563 |
| සී එච් ඩී හෙට්ටිආරච්චි මිය | | 542,800 |
| ධනුෂ්කා උස්හෙට්ටි මිය | 609,310 | 464,850 |
| ඩී කේ අයි විජේරත්න මයා | 440,668 | 335,610 |
| වයි එම් නිම්සාද් මයා | 380,875 | 297,788 |
| පී එල් මුණසිංහ මයා | 263,350 | 192,015 |
| එච් කේ එෆ් රමීසා මිය | | 251,500 |
| ඩී එම් පුෂ්පා දිසානායක මිය | 768,480 | 605,130 |
| දීපිකා දමයන්ති මිය | 618,000 | 478,610 |
| අයි එම් එස් නීලකාන්ති මිය | 733,080 | 571,205 |
| සීතා රත්නායක මිය | 733,080 | 563,040 |
| එච් එම් යූ හේරත් මයා | 501,160 | 377,280 |
| නයනා ලියනගේ මිය | 694,370 | 538,560 |
| චම්පිකා ගුණසේකර මිය | 537,320 | 408,240 |

**ජාතික සමාජ සංවර්ධන ආයතනය**
**2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
***( සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා මුදලින් දැක්වේ.)***

| | 2024 | 2023 |
|---|---|---|
| වයි මඩවලගේ මිය | 470,560 | 348,480 |
| නදීකා පී දිල්වා මිය | 438,080 | 317,700 |
| ෆාතිමා ෆරීහා මිය | 428,480 | 319,500 |
| ආර් දර්ශනී මිය | 300,360 | 216,480 |
| එස් එරංග මෙන්ඩිස් මයා | 485,600 | 290,325 |
| ඒ.ඩී. ජයසිංහ මිය | 273,405 | 200,300 |
| ආර්. එස් කේ. පින්තු මිය | 273,405 | 200,300 |
| ඩබලිව්.ඒ.එස්.වී.ලක්මාලි මිය | 273,405 | 200,300 |
| ඉසුරු නිමේෂ් සිල්වා මයා | 273,405 | 200,300 |
| එච්. සීලවතී මෙනවිය | 650,750 | 475,320 |
| ටී එම් කමලාවතී මිය | 237,550 | 168,795 |
| යූ එන් සමිත සිල්වා මයා | 246,800 | 168,795 |
| යූ ටී භානු මිය | 246,800 | 168,795 |
| එච්.කේ.ඩී.ඩබලිව්. ධර්මශ්‍රී මයා | 296,160 | 206,305 |

**උපලේඛනය - 06 කාර්ය මණ්ඩල ප්‍රතිලාභ අඛණ්ඩව....)**

| | 2024 | 2023 |
|---|---|---|
| අයි.එම්.ඩී.ආර්. මදුවන්ති මිය | 246,800 | 168,795 |
| ඩී එම් ආර් චරිතා මෙනවිය | 219,195 | 150,040 |
| ආර් පී ඩී අරුණෝදි මිය | | 148,840 |
| ටී ඩී ආරියදාස මයා | 213,795 | 150,040 |
| එස් එම් ටී බී සමරකෝන් මයා | 217,845 | 150,040 |
| පී විදානපතිරණ මයා | 521,000 | 387,410 |
| උපාලි රූපසිංහ මයා | | 340,765 |
| ජේ ඒ සමන්ත මයා | 403,360 | 298,425 |
| රුවන් චන්දන මයා | 318,370 | 224,160 |
| ඒ ඩී ඉන්දික පුෂ්පකුමාර මයා | 262,130 | 183,950 |
| වයි ජී එස් කේ ජයලත් මයා | 231,250 | 158,265 |
| ජෙසුලි ජිෆ්රි මයා | 704,160 | 539,500 |
| ඩී එම් පී දිසානායක මිය | 673,790 | 510,500 |
| අමිල සම්පත් මයා | | 448,910 |
| එස් රන් ජී ප්‍රේමරත්න මයා | 386,560 | 283,125 |
| දිලංක ගුණවර්ධන මයා | 272,640 | 193,435 |
| එස් එම් අසංක ජයරංග මයා | 276,660 | 194,150 |
| වයි එම් බී ගයාන් මයා | 250,635 | 175,250 |
| ඩී ඩී එම් ජයසිංහ මයා | 220,250 | 153,225 |
| ඒ එස් කේ අලංකාර මයා | 227,850 | 153,225 |
| ඒ වී නිෂාලි සිල්වා මිය | 227,850 | 155,475 |
| රුවිනි මධුෂානි මිය | 225,250 | 153,225 |
| ඩබලිව් ජී ඉන්දික ප්‍රසාද් | 212,445 | 147,640 |
| කේ පී සී නිමාලිකා මිය | 225,250 | 153,225 |
| බී ජී එම් සමරසිංහ මිය | | 195,225 |
| එම් ඩී ජේ එස් ගමගේ මිය | 168,385 | 112,530 |
| එම් එච් එල් සී දයාරත්න මිය | 168,385 | 112,530 |
| වී කජේන්ද්‍ර මයා | 168,385 | 109,830 |
| එම් එල් එම් සත්සර මයා | 168,385 | 112,530 |
| එච් පී එස් ජයතිලක මිය | 168,385 | 109,830 |
| ජී කරුණාකරන් මයා | 184,345 | 125,340 |
| ජේ ඩේවිඩ් මයා | 153,300 | 101,400 |
| චන්දි ලතිකා මිය | 118,025 | 72,620 |
| ටී රාජ්කමල් මයා | 108,875 | 66,600 |
| යූ එල් කේ එස් පියසේන මයා | 113,600 | 69,800 |
| ලක්මාල් ධනුෂ්ක මයා | 113,600 | 69,800 |
| ඊ එච් එල් මධුවන්ති | 113,993 | 63,245 |
| D.M.C.J බණ්ඩාර | 71,850 | |
| K.P.R.S අසංගිකා | 71,850 | |
| I.M.M.K ඉහලගෙදර | 71,850 | |
| | **35,650,122** | **31,663,462** |

ජාතික සමාජ සංවර්ධන ආයතනය
**2024** දෙසැම්බර් **31** වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
*( සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා මුදලින් දැක්වේ.)*

| | 2024 | 2023 |
|---|---|---|
| **උපලේඛනය- 07 ගෙවූ පාඨමාලා ගාස්තු ආදායම** | | |
| යුනිසෙෆ් වැඩසටහන් | | 1,065,031 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව හැටන්/නුවර/මඩක 22/23 | | 1,310,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව රත්න/ අම්පාර 21/23 | | 395,500 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව 2022/24 සීදූව (සි/ඉ/දෙ) | | 1,943,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව වවුනියා 22/24 - (දෙ) | | 1,130,000 |
| සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව 2022/24 සීදූව | | 325,000 |
| සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව 2023/25 සීදූව | 330,000 | 410,000 |
| කෙටි කාලීන පුහුණු වැඩසටහන් - සමෘද්ධි | | 491,500 |
| සමෘද්ධි නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය | | 524,625 |
| ජපන් භාෂා වැඩසටහන | 290,146 | 5,688,022 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2023/2025 (සි/ඉ/දෙ) | 6,481,075 | 9,009,075 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව JAF 23/24 (දෙ) | 1,752,025 | 1,847,975 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව 2023/25 See (සි/ඉ/දෙ) | 3,420,000 | 3,420,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව කිළිනොච්චි 2023/24 | 1,305,000 | 1,305,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව (තලාව) 2023/25 | 1,229,000 | 1,410,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව (පුත්තලම) 19/21 - (දෙ) | | 140,000 |
| ආසියානු අරමුදල් වැඩසටහන 2023 | | 2,100,000 |
| බාහිර උපාධිය BSW (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) 24/25 | 600,000 | |
| ආසියානු පර්යේෂණ ආයතනය-SHUKUTO | 46,405 | |
| HALO TRUST | 234,375 | |
| සමෘද්ධි නිලධාරීන් සඳහා EB විභාගය | 526,400 | |
| ජපන් භාෂා වැඩසටහන | 404,000 | |
| කෙටි කාලීන වැඩසටහන්: කෙටි කාලීන වැඩසටහන | 436,000 | |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2024/2026 (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | 9,853,000 | |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2023/2025 (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | 664,800 | |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2022/2024 (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | 655,000 | |
| ඩිප්ලෝමා උපදේශන. ත්‍රිකුණාමලය 24/25 T | 1,496,000 | |
| උපදේශන ඩිප්ලෝමාව. අම්පාර 2024/25 S | 2,214,000 | |
| උපදේශන ඩිප්ලෝමාව. මහනුවර 24/25 (S) | 3,172,000 | |
| උපදේශන ඩිප්ලෝමාව. යාපනය 24/25 T | 3,782,000 | |
| උපදේශන ඩිප්ලෝමාව. කිලිනොච්චි 2024/25 | 1,067,000 | |
| සීදූව/තලාව සහ කුරුණෑගල 24/25-S | 4,209,000 | |
| උපදේශන ඩිප්ලෝමාව. අම්පාර 2024/25 T | 125,000 | |
| උපදේශන ඩිප්ලෝමාව. 24/25 සීදූව (E/T) | 200,750 | |
| උපදේශන ඩිප්ලෝමාව. යාපනය 23/24 T | 615,400 | |
| උපදේශන ඩිප්ලෝමාව. 2023/24 බලන්න (සිංහල/දෙමළ /ඉංග්‍රීසි) | 690,000 | |
| උපදේශන වැඩසටහන් ඩිප්ලෝමාව: සම.කිලි 2023/24 | 697,000 | |
| | **46,495,376** | **32,514,729** |

**උපලේඛනය - 08 ස්ථාවර තැන්පතු පොලිය**

| | | | |
|---|---|---|---|
| එම්.එම්.එම්. නසීර් සහ පවුලේ අරමුදල | 143-6001-0000-330 | 8,250 | 16,764 |
| ඩැනියෙල් සැන්ඩර්ස් අරමුදල | | 23,293 | 38,278 |
| ස්වර්ණා ජයලත් අරමුදල | 20001-16-06956 | 1,372 | 3,015 |
| මහජන බැංකුව | | 10,971,417 | 18,053,736 |
| රාසනායගම් - මහජන බැංකුව MSW | 143-6001-0000-270 | 3,019 | 6,313 |
| ආර් ජයසිංහ (ඉමන්දි රොනාලි) | 143-6001-0000-215 | 2,063 | 3,972 |
| TG & MG - මහජන බැංකු MSW | 143-6001-0000-235 | 3,672 | 9,142 |
| | | **11,013,085** | **18,131,220** |

**ජාතික සමාජ සංවර්ධන ආයතනය**
**2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
*( සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා මුදලින් දැක්වේ.)*

| | 2024 | 2023 |
|---|---|---|
| **උපලේඛනය - 09 ලැබිය යුතු පාඨමාලා ගාස්තු** | | |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 20/22 (සි/ඉ/දෙ) | | 5,343,000 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2021/2023 (සි/ඉ/දෙ) | | 6,296,200 |
| උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 21/23 කොළඹ (සි) | | 150,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව අම්පාර 21/23 (දෙ) | | 194,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව ත්‍රිකුණාමලය 21/23 | | 124,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව යාපනය 21/23 T | | 51,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව නුවර 21/23 T | | 22,100 |
| උපදේශන ඩිප්ලෝමාව. ජැෆ්නා 23/24 ටී | 240,000 | |
| උපදේශන ඩිප්ලෝමාව ජැෆ්නා 24/25 ටී | 471,000 | |
| උපදේශන ඩිප්ලෝමාව. 24/25 සිදුව (E/T) | 14,000 | |
| උපදේශන ඩිප්ලෝමාව 23/24 කට්ටලය බලන්න | 1,859,500 | |
| උපදේශන ඩිප්ලෝමාව කිලිනොච්චි 24/25 | 1,341,000 | |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2022/2024 (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | 1,675,000 | |
| | **5,600,500** | **12,180,300** |

**උපලේඛනය - 10 ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අරමුදල් ආදායම**

| | |
|---|---|
| සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා 2021/22 | 111,400 |
| කෙටි කාලීන වැඩසටහන් | 10,000 |
| කෙටි කාලීන වැඩසටහන් | 20,000 |
| සමෘද්ධි නිලධාරීන් සඳහා EB විභාගය | 3,300 |
| සමෘද්ධි නිලධාරීන් සඳහා EB විභාගය | 4,840 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2022/2023 (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | 725,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව රත්න/අම්පාර 22-23 | 195,000 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව . 2023/24 බලන්න ( (සිංහල/දෙමළ /ඉංග්‍රීසි) | 1,290,000 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2022/2023 (සිංහල/දෙමළ /ඉංග්‍රීසි) | 625,000 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2022/2023 (සිංහල/දෙමළ /ඉංග්‍රීසි) | 650,000 |
| ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ අධ්‍යයනය පිළිබඳ සහතිකය | 132,000 |
| ආසියානු පර්යේෂණ ආයතනය-ෂුකුටෝ | 11,247 |
| සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව 24/25 | 174,000 |
| කෙටි කාලීන වැඩසටහන | 20,800 |
| ඩිප් ඉන් කෝ කිලි 23/24 -දෙමළ | 486,000 |
| ඩිප්. ඉන් කෝ. (යාපනය) 2023/24 | 720,000 |
| ධාරිතා සංවර්ධන වැඩසටහන | 31,200 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව කිලිනොච්චි 2024/25 | 317,200 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව 24/25-කුරුණෑගල සිංහල | 756,400 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව 2023/24 බලන්න (S/E/T) | 532,600 |
| | **6,815,987** |

**ජාතික සමාජ සංවර්ධන ආයතනය**
**2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
***( සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා මුදලින් දැක්වේ.)***

**උපලේඛනය - 11 සමුච්චිත අරමුදල**

| | 2024 |
|---|---|
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව. තලාව 21/23 | 25,000 |
| උපදේශනය සහතික පත්‍ර පාඨමාලාව 2022/23 | 20,840 |
| උපදේශනය සහතික පත්‍ර පාඨමාලාව ළමා කේන්ද්‍රීය 2022 | 13,500 |
| සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව 2021/22 | 232,200 |
| සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව 2020/21 | 93,500 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2021/2022 (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | 1,221,396 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2020/2021 (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | 135,000 |
| උපදේශන වැඩසටහන් පිළිබඳ ඩිප්ලෝමාව යාපනය 21/23 | 42,276 |
| උපදේශන වැඩසටහන් පිළිබඳ ඩිප්ලෝමාව මහනුවර 21/23 | 35,670 |
| උපදේශන වැඩසටහන් පිළිබඳ ඩිප්ලෝමාව කුරුණෑගල 21/22 | 156,178 |
| උපදේශන වැඩසටහන් පිළිබඳ ඩිප්ලෝමාව කිලිනොච්චි 20/22 | 145,910 |
| උපදේශන වැඩසටහන් පිළිබඳ ඩිප්ලෝමාව- තලාව 20/22 | 157,541 |
| උපදේශන වැඩසටහන් පිළිබඳ ඩිප්ලෝමාව . කිලිනොච්චි. 19/21 | 88,150 |
| උපදේශනයේ උසස් ඩිප්ලෝමාව 2021/23 | 104,659 |
| 2023 වර්ෂය සඳහා - ගෙවීම් චෙක්පත් ආදායම 38 | (16,200.00) |
| 2023 වර්ෂය - ගෙවීම් චෙක්පත් ආදායම 38 | (13,800.00) |
| තත්ත්ව සහතිකය - CQA (අවලංගු කරන ලද චෙක්පත) ආචාර්ය රවීන්ද්‍ර | (150,000.00) |
| උපදේශන ඩිප්ලෝමාව 2019/21 Col -T (පාඨමාලා ගාස්තු ආපසු ගෙවීම) | 25,000 |
| 2022 සහ 2023 මහපොළ මුදල් ආපසු ගෙවීම (නොපැමිණෙන සිසුන්) | 268,550 |
| ඉඩම් සහ ගොඩනැගිලි - රත්න භාරදීම | 26,804,948 |
| 2023 - ගෙවීම් නැවැත්වීමේ චෙක්පත් ආදායම 38 | (4,500.00) |
| ලැප් ටොප් - 2023/12/31 | (911,400.00) |
| සංශෝධිත අයවැය උපදේශන ඩිප්ලෝමාව 20/21 | 4,071,000 |
| සංශෝධිත අයවැය උපදේශන ඩිප්ලෝමාව 21/23 | 3,451,000 |
| පෙර වසරවල ගැලපීම - FD ශේෂය නිවැරදි කිරීම | (38,742.72) |
| පාඨමාලා ගාස්තු අතිරික්තය | 25,000,000 |
| සීදූව ගොඩනැගිල්ල (B) ජාලකරණය | (3,338,269) |
| විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථාන වියදම් | (649,605) |
| ශිෂ්‍යත්ව අරමුදල් | (453,417) |
| ණය අරමුදල | (2,000,000) |
| යුනිසෙෆ් වැඩසටහන් වියදම් | 650,000 |
| සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව .22/24 | 21,080 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව. රත්න/අම්පාර 22-24 | 450,566 |
| උපදේශන ඩිප්ලෝමාව..හැටන්/මහනුවර 22/24 | 87,710 |
| උපදේශන ඩිප්ලෝමාව.. 2022/23 බලන්න (S/E/T) | 824,500 |
| උපදේශන ඩිප්ලෝමාව. වවුනියාව 22/24 - ටී | 216,783 |
| | **56,767,023** |

**උපලේඛනය - 12 ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අරමුදල් වියදම**

| | |
|---|---|
| නෝවිද්‍යා දෙපාර්තමේන්තුව | 37,322 |
| මානව විද්‍යා දෙපාර්තමේන්තුව | 331,190 |
| සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව | 138,040 |
| පශ්චාත් උපාධි මධ්‍යස්ථානය | 970,000 |
| පුස්තකාල වියදම් | 493,080 |
| ශිෂ්‍ය සුභසාධන වියදම | 89,275 |
| විභාග ඒකක වියදම | 716,260 |
| උපාධි උත්සවය වියදම් | 780,000 |
| ගුණාත්මකභාවය සහතික කිරීමේ වියදම් | 2,884,675 |
| ඩිජිටල්කරණ වියදම | 602,181 |
| වාහන නඩත්තු වියදම | 1,446,237 |
| ඉන්ධන වියදම | 1,408,331 |
| වෙනත් සේවා සහ සැපයුම් ප්‍රධාන කාර්යාලය | 900,000 |
| තේ වියදම් සහ දුම්රිය වාර වියදම් | 275,587 |
| සීදූව ගොඩනැගිල්ල (B)ජාලකරණය | 3,338,269 |
| විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථාන වියදම් | 649,605 |
| | **15,060,051** |

# 04. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්ඩබ්/ඩී/එන්අයිඑස්ඩී/එෆ්එස්/2024

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025 මැයි 26 දින

අධ්‍යක්ෂ ජනරාල් ,
ජාතික සමාජ සංවර්ධන ආයතනය

**ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන තුළ වූ රු.120,718,042 ක වටිනාකමින් යුතු ජර්නල් සටහන් 35 ක් අසම්පූර්ණව සන්ලක්ෂය සඳහන් කිරීමෙන් තොරව ඉදිරිපත් කිරීම හේතුවෙන් එම ගණුදෙනුවල ගැලපුම් විස්තර පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා කාර්යාල උපකරණ මිලදී ගැනීම හා ගොඩනැගිල්ල ජාල ගත කිරීම (Networking) සඳහා වැය කරන ලද පිළිවෙලින් රු.649,605 ක් හා රු.3,338,268 ක වියදම් සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 ආයතනයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

3

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුවම අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) 1644 | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊලඟ මාසයේ 10 දිනට පෙර විගණනය වෙත ලබා දිය යුතු වුවත් ආයතනය සතු වාහන 08 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) 1645 | වාහන සම්බන්ධව ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝමීටර 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව |

4

නැවත ඉන්ධන පරීක්ෂාවක් සිදු කල යුතු වුවද, ආයතනය සතු වාහන 08 ක් ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණු අතර වාහන සම්බන්ධ අභ්‍යන්තර පාලනයද දුර්වල මට්ටමක පැවතුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ල) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ළ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ දී රු. මිලියන1,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර සැලසුම් කිරීම හා ඉදිකිරීම් (design and built) ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 818.795 ක ( වැට් හා අවිනිශ්චිත වැය හැර) මුදලකට අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටු අනුමැතියට යටත්ව 2017 සැප්තැම්බර් 19 දිනෙන් ආරම්භ කර 2020 අප්‍රේල් 04 දිනෙන් නිම කිරීමට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් 2017 සිට 2024 වර්ෂය දක්වා වාර්ෂිකව අයවැය දෙපාර්තමේන්තුව මගින් වෙන්කර තිබූ ප්‍රතිපාදන එකතුව රු.මිලියන 2,181.13 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ගොඩනැගිල්ලේ wing B කොටස වැඩ නිමකර භාරදී තිබුණද බිත්තිවල ජල කාන්දුවීම්, බිත්ති තැනින් තැන පිපිරීම, ටයිල් ඇතිරූ ස්ථානවල උස් පහත් වීම ඇතුළු සැලකිය යුතු අඩුපාඩු ප්‍රමාණයක් සහිතව භාරගෙන තිබුණි. රු.මිලියන 45.55 ක් බිම් ඇතුරුම් ගල් සඳහා වැය කර තිබුණු අතර ලංසු පිරිවිතර අනුව මිලදීගත යුතු බිම් ඇතුරුම් ගල් වෙනුවට වෙනත් වර්ගයක් මිලදීගෙන තිබුණි. කොන්ත්‍රාත් වටිනාකමට අතිරේකව රු.මිලියන 21.537ක ඇස්තමේන්තුවක්ද අනුමත කර තිබුණි. අවස්ථා අටකදී රටේ පැවති අර්බුදකාරී තත්ත්වයන් හේතුවෙන් ද අවස්ථා දෙකකදී මිල විචලනයන් හානි පූරණය කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ද කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි.පන්ති පැවැත්වීමට ඉඩකඩ නොමැතිවීම නිසා වැඩ අවසන් කර නොතිබූ wing A කොටසේ පළමු හා දෙවන මහලේ පන්ති පැවැත්වීමට යොදාගෙන තිබුණි.

(ii) 2024 ඔක්තෝබර් 30 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවට අනුව ගොඩනැගිලි සංකීර්ණ දෙකෙහි Wing B හි පොළවට බිම් ඇතුරුම් කිරීම හා Wing A හි තුන්වන මහලේ වර්ග අඩි 2,511.25 ක ප්‍රමාණයක් බිම් ඇතුරුම් (Tile) කිරීමට ඉතිරි වී තිබුණි. අතුරා තිබූ බිම් ඇතුරුම් ගල් (Tile) වල සමහර ස්ථානවල නිමාව දුර්වල මට්ටමක පැවතුණි. ලංසු පිරිවිතර අනුව භාවිතා කල යුතු සෙරමික් බිම් ඇතුරුම්ගල් නියමිත ප්‍රමිතියේ නොවන බව පරීක්ෂාකර තිබුණු අතර ප්‍රමිතියට අනුකූල නොවන අයිතම යොදා නිමකිරීම පිළිබඳ සැලකිල්ලක් නොදක්වා රු.මිලියන 45.554 ක් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි.සමහර බිත්තිවල තැනින් තැන ඉරි තැලීම් නිරීක්ෂණය වූ අතර 2021 දෙසැම්බර් 14 දිනැති මිල විචලනයන් සඳහා හානිපූරණය කිරීමට ලබා දුන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ගණනය කරන ලද මිල විචලනය රු.මිලියන 63.68 කි. (වැට් රහිත) ගොඩනැගිල්ල ප්‍රමිතියට අනුකූලව ඉදිකර නොතිබුණ ද එම මිල විචලනයන් ගෙවා තිබුණි.

(iii) 2017 සිට 2024 වර්ෂය දක්වා ඉදිකිරීම් සිදු කල ද ඉන් අපේක්ෂිත ප්‍රතිඵල අපේක්ෂිත පරිදි ලබා ගැනීමට මෙම වාර්තාවේ දිනය දක්වා නොහැකි වී තිබුණි.

5

(ආ) සමාජ සංවර්ධන ආයතනයේ සමාජ සේවා විද්‍යාලය, ලේඛකාධිකාරී කාර්යාලය හා පුහුණු අංශයෙන් සේවා ලබා ගන්නා ශිෂ්‍යයින් අදාල ගෙවීම් සඳහා භාවිතා කරන ශිෂ්‍ය ගෙවීම් වවුචරපත් (Paying Vouchers) අංශ වලින් වෙනත් ආයතන වලට (ප්‍රාදේශීය මධ්‍යස්ථානවලට) ලබාදී තිබුණි. මෙ හේතුවෙන් ආදායම් නිසි පරිදි අය වීම , ගිණුම් ගත කිරීම පිළිබඳ පරීක්ෂා කිරීමට නොහැකි වූ අතර අදාළ පාර්ශවයන්ට ලබාදිය යුතු වවුචර්පත්වල පිටපත් ගිණුම් අංශය වෙත ලබා දී තිබුණි. ආදායම් ගිණුම්ගත කිරීමේ ක්‍රියා පිළිවෙල නිසි පරිදි අනුගමනය නොකිරීම හා අභ්‍යන්තර පාලනයේ දුර්වලතා හේතුවෙන් ආදායම් ගිණුම්ගත කිරීමේ අක්‍රමිකතා සිදුවීමට ඉඩ ප්‍රස්ථා ඇතිවීමක් ශිෂ්‍යයින් අතරමග පාඨමාලා අතහැර දැමීම මත පාඨමාලා සඳහා අයකරන ගාස්තු නැවත ගෙවීමේදී ගැටළුකාරී තත්ත්වයක් මතුවන බවද නිරීක්ෂණය විය.

3. වෙනත් කරුණු

(අ) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අරමුදලට අදාලව මුදල් ලැබීම් හා වියදම් දැරීම පිළිබඳව කටයුතු කිරීමට අරමුදල වෙනුවෙන් ආරම්භ කල වෙනම ජංගම ගිණුමක් නොතිබූ අතර ඒ සඳහා දැනට පවත්වාගෙන යන ජංගම ගිණුමක් මගින් ගණුදෙනු සිදු කර තිබුණි. එම ගිණුම මගින් පාඨමාලා ගාස්තු වලට අදාල සියලු ගණුදෙනු වාර්තා කරන අතර , අරමුදලට අදාල සියලු ගණුදෙනුද එමගින් සිදු කර තිබුණි.

(ආ) ආයතනයේ වාර්ෂික උපාධි ප්‍රදාන උත්සවය පැවැත්වීම සඳහා අත්තිකාරම් ලෙස බාහිර ආයතනයකට ලබා දී තිබූ රු.120,000 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි.

(ඇ) ආයතනයට අයත් තක්සේරු වටිනාකම රු. 10,600,000 ක් වූ කැළණිය සිසු නේවාසිකාගාරය 2020 ජූනි මාසයේ සිට භාවිත කරමින් තිබූ භාණ්ඩ ද සමඟ වාර්තාවේ දිනය දක්වා නිශ්කාර්යව පැවතුණි. මෙම නේවාසිකාගාරය භාවිතයෙන් තොරව පැවති කාලය වසර 04 ක් ඉක්මවා තිබුණු අතර එය නිසි නඩත්තු කිරීමක් සිදු කර නොමැති බැවින් නේවාසිකාගාරය විනාශ වෙමින් පැවතුණද කළමනාකරණය විසින් මෙම දේපල පිළිබඳව කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

ජී.එච්.ඩී ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

6

**ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවේ අන්තර්ගත නිරීක්ෂණ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්ගේ අදහස් ඇතුළත් වාර්තාව.**

**1.2 තත්ත්වා ගණනය කළ මතය සඳහා පදනම**

(අ) 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා ඉදිරිපත් **කිරීමේදී පොදු ලෙජරයේ මෘදු පිටපතක්ද ඒ සමඟ ඉදිරිපත් කරන ලද අතර, එම පොදු ලෙජරයේ ජනල් සටහන් 35ට අදාල සංලක්ෂයන් සහිතව ඉදිරිපත් කර ඇත.** එසේම, අදාල ජනල් සටහන් 35 වෙන වෙනම ගොනුවක් උපකාරක ලියවිලි සමඟ විගණනය සඳහා ලබා දුන් බවත් විගණනයේදී ඉහත සඳහන් ජනල 35ට අදාළව පැන නැගුණු ගැටළු සඳහා උපරිමයෙන් සහයෝගය ලබා දුන් බවත් මෙයින් කාරුණිකව දන්වා සිටිමි. ඉදිරියේදී ගණුදෙනු වලට අදාල මූලික තොරතුරු හා ජර්නල් සටහන් විධිමත් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට වගබලා ගනිමි.

(ආ) මෙම රු 649 605/- සහා රු 3,338,268/- වියදම පිළිවෙලින් ආයතනයට කාර්යාල යන්ත්‍ර උපකරණ, පරිගණක මිලදී ගැනීම හා සීදූව win (B) ගොඩනැගිල්ලේ ජාලගත කිරීම සඳහා පාලක සහා අනුමැතිය යටතේ ජාතික සමාජ සංවර්ධන අරමුදලින් මිලදී ගැනීම සිදු කරන ලද අතර 38 ගිනුම හරහා ගෙවීම් කටයුතු සිදු කරන ලදි. ජාතික සමාජ සංවර්ධන අරමුදල සඳහා වෙනම ජංගම ගිණුමක් අප ආයතනය පවත්වා ගෙන යනු නොලබන අතර ජාතික සමාජ සංවර්ධන අරමුදලට අදාල ගනුදෙනුද සිදු කරනු ලබන්නෙ 38 ගිනුම මගිනි. ඉදිරියේදී ජාතික සමාජ සංවර්ධන අරමුදල සඳහා වෙනම ගිණුමක් ආරම්භකර පවත්වාගෙන යාමට වගබලා ගනිමි.

2.2.2 රීති රෙගුලාසි සහ කළමානාකරණ තිරණ ආදියට අනුකූල නොවීම

(අ)

**(i) මු.රෙ. 1644** - දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊළග මාසයේ 10 දිනට පෙර විගණනය වෙත යැවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. ඒ අනුව 2025 මැයි මස සිට අදාළ සටහන් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.

**(ii) මු.රෙ. 1645** - ආයතනය භාරයේ ඇති සෑම වාහනයක් සම්බන්ධවම වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇති අතර එම කටයුතු සිදුකර අවසන් කර ඇති බව කාරුණිකව දන්වමි.

(ආ) **2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය**

- 2025 වර්ෂයේ ඉන්ධන දහන පරික්ෂණ කටයුතු සිදුකර අවසන් කිරීමට කටයුතු යොදා ඇත.

2.2.4

(අ) 2017 වසරේ සිට 2024 වසර දක්වා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 2181.13 ක් ලබා දී ඇත.ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සංස්ථාව වෙත 2017.09.19 දිනැතිව කොන්ත්‍රාත් ප්‍රධානය කරන ලද අතර 2017.10.04 දිනැතිව ගිවිසුම් අත්සන් කරන ලදී. ඒ අනුව 2017 නොවැම්බර් මස සිට ඉදිකිරීම් ආරම්භ විය.2017 වසරේ සිට 2024 දක්වා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන් කළද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ඉදිරිපත් වූ බිල්පත් , සහතික කිරීමේ ඉංජිනේරුවරයා විසින් සහතික කිරීමෙන් පසු අමාත්‍යාංශය විසින්ගෙවීම් කිරීම සිදුකර ඇත. 2024 දෙසැම්බර් වන විට ඉදිරිපත් කරන ලද බිල්පත් 63ක් සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවීම් සිදුකර ඇත.

(I) රාජගිරියේ කොස්වත්ත ප්‍රදේශයේ බදු කුලී පදනම් මත ලබාගන්නා ලද ගොඩනැගිල්ලක පවත්වාගෙන ගිය ආයතනය 2020 වසරේ සිට සීදූව ප්‍රදේශයේ ස්ථාපනය කිරීමට හැකිවන පරිදි 2019.02.27 දිනැති අ.ම.ප.19/0045/132/005 මගින් අමාත්‍ය මණ්ඩල තීරණය ලබාදී තිබූ බැවින් සම්පූර්ණයෙන්ම වැඩ අවසන් නොවූ සීදූව, ලියනගේමුල්ලේ ඉදිකරමින් තිබූ ගොඩනැගිලි සංකීර්ණයේ wing B ගොඩනැගිල්ල වෙත ආයතනය රැගෙන ඒමට සිදුවිය.ඒ අනුව wing B ගොඩනැගිල්ල බාර ගැනීමට සිදුවූවත් එහි අඩුපාඩු සකස් කර දෙන මෙන් නිරන්තරයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ඉල්ලීම් සිදු කරන ලදී.

බිම් ගල් ඇතුරුම් සඳහා ලන්සු පිරි විතර අනුව මිලදී ගත යුතුව තිබුණේ සෙරමික් බිම් ගල් ඇතුරුම් වේ. 2020 සිට2022 දක්වා ඇතිවූ ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ඉහළ යාම හා ඉදිකිරීම් ද්‍රව්‍යවල ඇති වූ හිඟය යන කරුණු හේතුවෙන් ලංසු පිරිවිතරයන්හි සඳහන් (equivalent) සමාන ආදේශක යොදා බිම් ගල් අතුරා ඇත. ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල උච්ඡාවචනයහානි පූර්ණය කිරීම සම්බන්ධයෙන් 2021.02.06 දිනැති අ.ම.ප.21/2084/306/094 අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සිදු කරන ලද ඉල්ලීම සලකා බලා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව 2024/07/09 දිනැති අ.ම.ප.24/1437/629/015 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රු. මිලියන 63.68 ක් (වැට් රහිතව) ගෙවන ලද අතර රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් 2024.01.10දිනැතිව ඉදිරිපත් කරන ලද කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ගැනීමේ ලිපියට අනුව ඔවුන් සඳහන් කර ඇත්තේ මිල විචලනය සඳහා ගෙවීම් කිරීමෙන් පසු මාස 04 ක කාලයක් තුළ ඉදිකිරීම් අවසන් කරන බවයි.ඒ අනුව 2024 නොවැම්බර් හා දෙසැම්බර් යන මාස දෙකෙහි මිල විචලනය සඳහා ගෙවීම් සිදුකර ඇත.

ගොඩනැගිල්ල සඳහා ලබාදෙන ලද මූලික ඇස්තමේන්තුවට අමතරව ගොඩනැගිල්ලි නිර්මාණ සැලැස්ම අධ්‍යයන ආයතනයකට වඩා ගැලපෙන ආකාරයට ඉදිරිපස සැලැස්ම හා භූමියේ වෙනස්කම් සිදුකරන ලද අතර ඒ වෙනුවෙන් රු. මිලියන 21.537ක් සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 19/0445/132/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත.

2025.03.31 වන විට wing A ගොඩනැගිල්ලේ බිම් මහල හා 1වන මහලේ බෙදා වෙන් කිරීම් සිදුකරු බාර දෙන ලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත දැනුම් දෙන ලදී. ඒ අනුව බෙදා වෙන් කිරීම් සිදුකර බාරදී ඇති අතර වහාම පාලන, මුදල්, විගණන හා ලේඛකාධිකාරී යන අංශ wing A ගොඩනැගිල්ල වෙත රැගෙන ගිය අතර Wing B ගොඩනැගිල්ලේ හිස්වන ඉඩකඩ සිසුන්ගේ දේශන හා අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා වෙන්කර දී ඇත.

(II). 2022.03.15 දිනැතිව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ව්‍යාපෘති වාස්තු විද්‍යාඥවරයා විසින් යොමුකරන ලද අංක (2017-65-02)A/011 දරන ලිපිය මගින් රොසෙල් ටයිල් වල හිඟතාවය හා ටයිල් නිෂ්පාදනයේ ඇති ගැටලුකාරී තත්ත්වය මෙන්ම රටේ පවතින අධික ඉල්ලුම හේතුවෙන් ටයිල් සැපයීම ප්‍රමාද වන බවදැනුම් දී ඇත.මේ පිළිබඳ අමාත්‍යාංශයෙන් පත්කරන ලද තාක්ෂණ නිලධාරී නිර්දේශයද සලකා ලංසු පිරිවිතරයන්හි සඳහන් (Equivalent) සමාන ආදේශකය වන ලංකා ටයිල් භාවිතා කිරීමට අනුමැතිය අමාත්‍යාංශ ලේකම් විසින් ලබා දී ඇත.2022.04.04 දිනැති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ගේ අංක NISD/DA/SEEDUWA/2022 දරණ ලිපිය මගින් බිම් ඇතුරුම් සඳහා ලංකා ටයිල් භාවිතා කිරීමට අවසරය ලබා දී ඇත.ඒ අනුව දෙවන හා තුන්වන මහලේ කොටසක් ලංකා ටයිල් ඇතිරීම සිදුකර ඇත.මෙම ටයිල් සඳහා 2024 ජූනි මාසය වන විට ගෙවීම් සිදුකර ඇත.2024ඔක්තෝබර් 30 සිදු කරන ලද විගණන නිරීක්ෂණයන්ට අනුව හඳුනා ගන්නා ලද අඩුපාඩු අතරින් wing B හි පොළොවට ටයිල් අතුරා නොතිබූ කොටසෙහි සහ wing A හි තුන්වන මහලේ ටයිල් ඇතිරීම සඳහා ඉතිරිව තිබූ වර්ග අඩි ප්‍රමාණයන්හි සම්පූර්ණයෙන්ම ටයිල් ඇල්ලීම අවසන් කර ඇත .

ඉදිකිරීම් ද්‍රව්‍යවල මිළ විචලනය හේතුවෙන් ගෙවීම් කිරීම සඳහා ලබාගන්නා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මිළ විචලනය සඳහා වන ගෙවීම් සිදුකර ඇත.ඉදිකිරීම් ඉදිකිරීම් වල ඇති අඩුපාඩු සකස් කිරීමට හා ප්‍රමිතිය පිළිබඳ සොයා බලා ගෙවීම් කිරීම සඳහා ගොඩනැගිල්ලේ වියදම් ඇස්තමේන්තුව තුල රඳවා ගැනීම (Retention)සිදුකර ඇත.

(III) ගොඩනැගිලි සංකීර්ණයේ Wing B ගොඩනැගිල්ල 2020 වසරේ සිට අධ්‍යයන හා පරිපාලන කටයුතු සඳහා යොදා ගැනීම සිදුකරන ලදි. Wing A ගොඩනැගිල්ලේ 3 වන මහලේ ශ්‍රවනාගාරය හා 2 වන මහලේ කොටසක් හැරුණු කොට අනික් සියලුම කොටස් 2023 වසරේ සිට භාවිතා කරමින් පවතී.

(ආ) මේ පිළිබඳව අදාළ අංශ දැනුවත් කල අතර, ප්‍රාදේශීය මධ්‍යස්ථාන සඳහා නිකුත් කිරීමේ දී අංශය වෙත නිකුත් කරන ලද (Paying Voucher) පොත් ලබා නොදී ගබඩාවෙන් ඍජුව ප්‍රාදේශිය මධ්‍යස්ථාන සඳහා නිකුත් කිරීමට උපදෙස් ලබා දී ඇත. එසේම මේ පිළිබඳව අදාළ අංශ දැනුවත් කල අතර, ඉදිරියේදී ලදුපත් පොතක් අවසන් වූ වහාම අනික් පොත නිකුත් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත.

3. වෙනත් කරුණු

(අ) මෙතෙක් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අරමුදල සඳහා ජංගම ගිණුමක් පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර ඉදිරියේදී ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අරමුදලට අදාලව ගණුදෙනු කිරීම සඳහා පාලක සභා අනුමැතියකින් ජංගම ගිණුමක් ආරම්භ කිරීමට ඉදිරියේ දි කටයුතු කරමි.

(ආ). ආයතනයේ වාර්ෂික උපාධි ප්‍රධානෝත්සවය 2024 ජූලි මාසයේදී පැවැත්වීමට සැලසුම් කරන ලද බැවින් මේ සඳහා BMICH වෙත රු.120,000.00 ක අත්තිකාරම් මුදලක් ගෙවා දින වෙන්කරගන්නා ලදී. නමුත් පාඨමාලාවේ විභාග ලකුණු නිකුත් කිරීමේ ඇතිවූ දෝෂ සහගත තත්ත්වයන් හේතුවෙන් එම දිනය 2024 ඔක්තෝබර් දක්වා කල්දමන ලදී. නමුත් 2024 වර්ෂය තුල BMICH වෙතින් වෙනත් දිනයක් වෙන්කර ගැනීමේ හැකියාවක් නොමැති වූයෙන් නෙලුම් පොකුණු රඟහලේදී උපාධි ප්‍රධානෝත්සවය පැවැත්වීමට තීරණය වී ඇත.

BMICH වෙත ගෙවන ලද අත්තිකාරම් මුදල නැවත ගෙවන ලෙස ආයතනයේ ලේඛකාධිකාරී විසින් වාචිකව හා ලිඛිතව ඉල්ලා සිටියත් එය ගෙවිය නොහැකි බව BMICH පාලන අධිකාරිය විසින් දැනුම් දී ඇත.

සීදූව, ලියනගේමුල්ල ප්‍රදේශයේ අප ආයතනය සඳහා ඉදිවෙමින් පවතින වර්ග අඩි 100,000 යුත් ගොඩනැගිලි සංකීර්ණයේ මේ වන විට ඉදිකිරීම් 98.19% අවසන් වී ඇත. මෙම ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අවසන් වීමත් සමග ආයතනයේ අධ්‍යයන කටයුතු සඳහා බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව ප්‍රවර්ධනය කිරීමට අවස්ථාව සැලසෙන අතර රටේ පවතින අවශ්‍යතා අනුව නව පාඨමාලා ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමටද හැකියාව ලැබෙනු ඇත.

ආයතනයේ සමාජ වැඩ උපාධි වැඩ සටහන් සාර්ථකව නිම කළ උපාධිධාරීන්ට රැකියා වෙළඳපොලේ විශාල ඉල්ලුමක් ඇති අතර ඔවුන් ප්‍රධාන ලෙස ඔස්ට්‍රේලියාව, එක්සත් ජනපදය, නවසීලන්තය, වැනි රටවල සමාජ වැඩ වෘත්තිකයින් ලෙස සේවය කරනු ලබයි. මෙමගින් පුද්ගල සංවර්ධනයට පමණක් නොව රටේ විදේශ විනිමය ඉපැයීමටද දායක වී ඇත. තවද අප ආයතනයේ උපාධිධාරීන් රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශ දෙකෙහිම රැකියා අවස්ථා ද ලබාගෙන ඇති අතර, ඔවුන්ගේ වෘත්තිය කුසලතා සමාජයේ අභිවෘද්ධිය සඳහා ප්‍රයෝජනයට ගෙන ඇත.

මේ වන විට ආයතනය විශ්ව විද්‍යාල තත්වයට උසස් කිරීම සඳහා මූලික කටයුතු ක්‍රියාත්මක වන අතර ඊට සමගාමීව නව උපාධි පාඨමාලා ආරම්භ කිරීම ඇතුළු අධ්‍යයන පහසුකම් ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භකර ඇත. මේ තුළින් සිසුන් විශාල පිරිසකට උසස් අධ්‍යාපනයට ප්‍රවේශවීමේ අවස්ථාව පුළුල් වනු ඇත. අපගේ සියලුම අධ්‍යයන වැඩ සටහන් විශිෂ්ටත්වය සහතික කිරීම සඳහා SCAQA (Standing Committee on Accreditation and Quality Assurance) විසින් අධීක්ෂණය කරන ලද තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලිය අපි සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. වසර 72 ක ඉතිහාසයක් හරහා තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට ප්‍රශංසනීය දායකත්වයක් මෙම ආයතනය ලබාදෙමින් සිටී.

මහාචාර්ය ඩී.ඒ. ප්‍රේමකුමාර ද සිල්වා
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.),
ජාතික සමාජ සංවර්ධන ආයතනය

**National Institute of Social Development**
Liyanagemulla,
Seeduwa,
Sri Lanka

Tel : +94 112 882 506 / 07
Fax :+94 112 882 502
E-mail : info@nisd.ac.lk
web : www.nisd.ac.lk